ජාතික
ගොඩනැගිලි
පර්යේෂණ
සංවිධානය

2021 වාර්ෂික වාර්තාව

පටුන

ජා. ගො. ප. සංවිධානය 3
විධායක වාර්තාව 4
දැක්ම, මෙහෙවර සහ ඉලක්කයන් 8
ජා. ගො. ප. සංවිධානයේ කළමනාකරණය 9
ආයතනික ව්‍යුහය 10
වැදගත් සිදුවීම් (මෙහෙයුම් විශේෂ අවස්ථා) 11
රාජ්‍ය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති 12
නායයෑම් ආපදා කළාප සිතියම්ගත කිරීමේ ව්‍යාපෘතිය (LHMP) 12
නායයෑම් විශේෂ විමර්ශන (SPI) 13
නායයෑම් අවදානම තක්සේරුකර වාර්තා නිකුත්කිරීමේ ක්‍රියාවලිය (LRAR) 13
නායයෑම් අවම කිරීමේ වැඩසටහන් (රාජ්‍ය අරමුදල්) 14
නායයෑම් අවදානම සහිත ප්‍රදේශ සඳහා අවදානම් පැහැදිලි කිරීම 14
ගොඩනැගිලි තක්සේරුකරණය සහ තත්ත්ව වාර්තාකරණය සඳහා ක්‍රමෝපාය සංවර්ධනය කිරීම 15
තත්‍යකාලීන නායයෑම් පුරෝකථනය සහ පූර්ව අනතුරු ඇඟවීම් හැකියාව වැඩිදියුණු කිරීම 15
ශ්‍රී ලංකාව තුල රසායනික ආපදා අවදානම පිළිබඳ විධිමත් තක්සේරුකරණය 15
පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් 17
ශ්‍රී ලංකාව සඳහා වහල මත වැසිදිය රැස්කිරීමේ පද්ධති සඳහා සැලසුම් අත්පොතක් 18
ඉවතලන ද්‍රව්‍ය යොදාගනිමින් පිරිවැය ඵලදායී හරිත පෙදරේරු නිෂ්පාදන සංවර්ධනය කිරීම 19
සිම්පෝසියම 20
නායයෑම් පූර්ව අනතුරු සඳහාවන “NBRO EW” ජංගම දුරකතන යෙදවුම 22
පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු 23
ප්‍රධාන උපදේශන ව්‍යාපෘති 24
ඉදිකිරීම් ව්‍යාපෘතිවල භූ තාක්ෂණික ගැටලු නිරවුල් කිරීම 24
ගොඩනැගිලි පිළිබඳ තත්ත්ව වාර්තා නිකුත්කිරීම 24
මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා භූ තාක්ෂණික විමර්ශන සහ සැලසුම් 24
අනෙකුත් තාක්ෂණික මැදිහත්වීම් 25
‘දීඝවාපී ස්තූපයේ’ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ගඩොල්වල ගුණාත්මක සංවර්ධනය 25
කොළඹ මහනුවර මාර්ගයේ කඩුගන්නාව ප්‍රදේශයේ බෑවුම් අස්ථාවරත්වය 25
කොළඹ වරාය ආසන්නයේ MV X-press Pearl නෞකාවේ ඇතිවූ ගින්න හේතුවෙන් වායු දූෂණය කෙරෙහි ඇතිවූ බලපෑම 26
වෙනත් ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් 28
විදේශීය/දායකත්ව සහයෝගිතා සහිත ව්‍යාපෘතීන් 29
ජා. ගො. ප. සංවිධානයේ ප්‍රකාශන 33
මූල්‍යමය විශේෂ අවස්ථා 35
මූල්‍යමය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 36
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය 37
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 38
ගිණුම් සටහන් 39
මානව සම්පත් කළමනාකරණය/ධාරිතා සංවර්ධනය 40
විගණකාධිපති වාර්තාව 2021 42

2021 වාර්ෂික වාර්තාව ජා. ගො. ප. සංවිධානයේ අන්තර් කළමනාකරණ කමිටුව (IMC) විසින් 2022 පෙබරවාරි 22 වන දින පැවති රැස්වීමේ දී අනුමත කරන ලදී

ජා. ගො. ප. සංවිධානය

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (ජා. ගො. ප. සංවිධානය) 1983 සැප්. 29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 1984 මාර්තු 05 දින සංස්ථාපනය කරන ලදී. අද වන විට වසර 38 කට ආසන්න කාලයක් පුරා තාක්ෂණික සේවා සපයන කීර්තිමත් ආයතනයකි. ජා. ගො. ප. සංවිධානය ප්‍රමුඛ පෙළේ කැපී පෙනෙන පර්යේෂණ හා සංවර්ධන ආයතනයක් මෙන් ම, නායයෑම් අවදානම් කළමනාකරණය සඳහාවන ජාතික කේන්ද්‍රස්ථානය වශයෙන් ද පත් ව ඇත.

ජා. ගො. ප. සංවිධානය යනු අනු පිළිවෙලින් ගොඩනැගිලි ද්‍රව්‍ය පර්යේෂණ හා පරීක්ෂාකිරීමේ අංශය, පාරිසරික අධ්‍යයන සහ සේවා අංශය, භූ තාක්ෂණික ඉංජිනේරු පරීක්ෂණ අංශය, මානව ජනාවාස සැලසුම් හා පුහුණු අංශය, නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ අංශය යන තාක්ෂණික අංශ හය සහ පරිපාලන අංශය, මුදල් අංශය, තොරතුරු සන්නිවේදන හා වැඩසටහන් ඒකකය මෙන් ම අභ්‍යන්තර විගණන ඒකකය යන අංශයන් හි සහයෝගීතාවය යටතේ ක්‍රියාත්මකවන බහු ශික්ෂිත ආයතනයකි.

කීර්තිමත් පර්යේෂණ ආයතනයක් වශයෙන් පාර්ශවකාර ආයතන විසින් සිදුකරනු ලබන ඉල්ලීම් පරිදි සහ තම විෂය පථය හා සම්බන්ධ පර්යේෂණ සිදුකරනු ලබයි. මහා භාණ්ඩාගාරය විසින් මෙම පර්යේෂණ කටයුතු සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සපයනු ලබන අතර ඒවායේ ප්‍රගති වාර්ෂික ව ප්‍රකාශයට පත්කෙරේ. ශ්‍රී ලංකාව තුල නායයෑම් අවදානම කළමනාකරණය සඳහාවන කේන්ද්‍රස්ථානය වශයෙන් ජා. ගො. ප. සංවිධානය විසින් බෑවුම් අස්ථායීතාව හඳුනාගැනීමේ ක්‍රියාකාරකම්, ආශ්‍රිත අවදානම් තක්සේරු කිරීම, අවදානම් කලාප සිතියම්ගත කිරීම, නායයෑම්වල වලනය සහ නායයෑම් අවදානම් ප්‍රදේශවල වර්ෂාපතනය නිරීක්ෂණය කිරීම, නායයෑම් පිළිබඳ පූර්ව අනතුරු හැඟවීම් නිකුත්කිරීම මෙන් ම නායයෑම් අවමකිරීම යන කටයුතු සිදුකරනු ලබයි. නායයෑම් ඇතිවිය හැකි ප්‍රදේශවල ඉදිකිරීම් සහ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා අනිවාර්ය අංගයක් ලෙස අවදානම් ඇගයීම් වාර්තා නිකුත් කිරීම ද සිදුකරනු ලබයි.

ආදයම් උපයා යැපෙන, ආයතනයක් වශයෙන් ජා. ගො. ප. සංවිධානය මහජනතාව, රාජ්‍ය අංශයේ ආයතන, පෞද්ගලික සමාගම් සහ ජාත්‍යන්තර ආයතන වෙත පරීක්ෂණ හා තාක්ෂණික උපදේශන සේවා සැපයීම ඔස්සේ සිදුකරන ඉපයීම් තුලින් තම පුනරාවර්තන වියදම් අවශ්‍යතා සපුරාගනු ලබන ආයතනයකි. සංවිධානය සතු ජාත්‍යන්තර තත්ත්ව ආයතනයේ ප්‍රතීතනය ලත් අධි තාක්ෂණික උපාංගයන්ගෙන් සැදුම්ලත් පාංශු පර්යේෂණාගාරය මඟින් ප්‍රමුඛතම ආයතනයක් වශයෙන් භූ තාක්ෂණ ඉංජිනේරු ම ය පරීක්ෂණයන්, ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සහ නායයෑම් අවමකිරීම සඳහා විමර්ශනයන් ජා. ගො. ප. සංවිධානය සිදුකරනු ලබයි. ජා. ගො. ප. සංවිධානය විසින් ගාස්තු මත පදනම් සේවා ලෙස ඉදිකිරීම් සඳහා ගොඩනැගිලි ද්‍රව්‍යවල යෝග්‍යතාව පරීක්ෂාකිරීම, ආපද අවදානම සහ නායයෑම් තක්සේරුකිරීම, පිරිවැය ඵලදායී ආපද ප්‍රතිරෝධී නිවාස සංවර්ධනය හා මානව ජනාවාස සැලසුම්කිරීම, ජලය, අපජලය, පස, අවසාදිත වාතය සහ සමුච්ච විමෝචන පරීක්ෂාකිරීම, ගොඩනැගිලි තත්ත්ව හා ව්‍යුහාත්මක අඛණ්ඩතාව තක්සේරුකිරීම මෙන් ම තාක්ෂණික උපදේශන සේවා ලෙස වෙනත් විවිධ ආශ්‍රිත අධ්‍යයනයන් තුලින් ජා. ගො. ප. සංවිධානය වෙත ආදයම් රැස්කිරීම සිදුවේ.

ජනතාව තමන් ජීවත්වන වටාපිටාවෙහි මුහුණ දෙන අවදානම් සහිත කඳු, මෘදු භූමි, දූෂිත වාතය, දූෂිත ජලය, දුර්වල ඉදිකිරීම් සහ ප්‍රමිතියෙන් තොර ගොඩනැගිලි ද්‍රව්‍ය පිළිබඳ ගැටලු ආදියෙහි ජා. ගො. ප. සංවිධානයෙහි සහාය අපේක්ෂා කරයි. ජා. ගො. ප. සංවිධානය වගකිවයුතු සේවා සපයන්නෙකු වශයෙන් විවිධ ක්ෂේත්‍රයන් හි තාක්ෂණික ප්‍රවීනයන් හා එක් ව සියලු පුරවැසියන්ගේ ජීවන තත්ත්වය පවත්වාගෙන යාම හා වැඩිදියුණු කිරීම සඳහා උචිත විසඳුම් සැපයීමට බැඳී සිටී.

විධායක වාර්තාව



2021 වසර තුල දී රට තුල පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හා උද්ගත බාධාවන් මධ්‍යයේ වුව ද තම වගකීම හා කාර්යභාරයන් උපරිම සක්‍යතාවයකින් යුතු ව ක්‍රියාවට නැංවීමට සමත් ව ඇත. මෙම බාධාවන් කාර්ය මණ්ඩලය වෙත තම කාර්යභාරයන් හා සම්බන්ධවීමේ භෞතික තත්ත්වයන් මෙන් ම උපදේශන සේවා සැපයීම තුලින් මූල්‍ය ම ය ඉපැයීම යන දෙඅංශයන් කෙරෙහි ම අහිතකර ලෙස බලපා ඇත. කෙසේ වෙතත් ජා. ගො. ප. සංවිධානය වගකීම් සහිත රාජ්‍ය ආයතනයක් වශයෙන් පවරණ ලද කාර්යයන් නිසියාකාරව ක්‍රියාත්මක කර ඇති අතර 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මෙම වාර්ෂික වාර්තාව සහ ජා. ගෙ. ප. සංවිධානයෙහි මූල්‍ය ම ය ප්‍රකාශනය සම්පාදනය කර ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසීම මා ලද සුවිශේෂී භාග්‍යයක් ලෙස සලකමි.

මෙම 2021 වසරේ මැයි, ජූනි මාසවල නායයෑම් සහ බෑවුම් අස්ථාවරවීම් කීපයක් වාර්තාව වූ අතර නොවැම්බර් මාසය තුල සැළකිය යුතු නායයෑම්, පාෂාණ පතිතවීම්, බෑවුම් සහ රැඳවුම් බිත්ති අස්ථාවරවීමේ සිදුවීම් කීපයක් රත්නපුර, කෑගල්ල කළුතර, මහනුවර සහ කුරුණෑගල දිස්ත්‍රික්කවලින් වාර්තා විය. මෙහිදී ජා. ගෙ. ප. සංවිධානය විසින් නිරීක්ෂණය කිරීම්, ප්‍රජාව ඉවත්කිරීම් සඳහාවන පූර්ව අනතුරු හැඟවීම් සහ නිවැරදි කිරීමේ මෙන් ම අවමකිරීමේ හා වැලැක්වීමේ පූර්ව පැවරුම් භූමිකාවන් ඉටුකරන ලදී.

මහා භාණ්ඩාගාරය සහ අනෙකුත් මූල්‍ය ආයතනවලින් සැපයෙන අරමුදල් යටතේ ක්‍රියාත්මක ආපදා අවදානම් අවමකිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අඛන්ඩ ව ක්‍රියාත්මක කරන ලදී. වඩාත් වැදගත් කාරණය නම් ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවෙහි (AIIB) මූල්‍ය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක 'ස්ථායීකරන ක්‍රමවේද මහින් නායයෑම් අවදානම අවමකිරීමේ ව්‍යාපෘතිය' මහින් නායයෑම් අවදානම් අවමකිරීමේ කටයුතු ස්ථාන 24 ක මේවන විටත් ආරම්භ කර ක්‍රියාත්මක වෙමින් පවතින අතර තවත් ස්ථාන 32 ක කටයුතු ආරම්භකර මේවන විට ප්‍රසම්පාදන අදියරෙහි පවතී. ජා. ගො. ප. සංවිධානය විසින් පාසල්, ආරෝග්‍යශාලා සහ වැදගත් ගොඩනැගිලි මෙන් ම ප්‍රධාන මාර්ග සහ දුම්රිය මාර්ග ආශ්‍රිත ව ක්‍රියාකාරීත්වයන් තර්ජනයට ලක් ව ඇති හඳුනාගත් අඩවි 147 ක සියලු අවමකිරීමේ කටයුතු 2025 වසර වනවිට සම්පූර්ණ කිරීමට අපේක්ෂාකර ඇත.

ජා. ගො. ප. සංවිධානය විසින් තම පාරිභෝගිකයින් වෙත උසස් ප්‍රමිතියෙන් හා ගුණාත්මකබවින් යුත් තාක්ෂණික උපදේශන සේවා සහ පර්යේෂණාගාර සේවා නියමිත වේලාවට සැපයීම් සඳහා අඛන්ඩ ව ක්‍රියාත්මක වී ඇත. ISO 17025 ප්‍රතීතනයට ලක් ව ඇති පර්යේෂණාගාර තුන ම නිසි පරිදි නඩත්තු කිරීම් සිදුකරන ලද අතර නියමිත සියලු ආකාරයේ අභ්‍යන්තර හා බාහිර විගණනයන් නිසි කලට සිදුකර ඇත. පර්යේෂණ පහසුකම් සැපයීම සහ උපදේශන සේවා සැපයීම තුලින් 2021 වසරේ දී ලැබූ ආදායම රු. මිලියන 860.2 ක් හා ලාභය රු. මිලියන 70.4 ක් ලෙස වාර්තා විය. මෙය ආයතනයෙහි මූල්‍ය කාර්යසාධනය සඳහා මෙන් ම ආයතනික ස්ථාවරත්වය සඳහා ද දායක වී ඇත. ජා. ගො. ප. සංවිධානය 2010 වසරේ සිට නොකඩවා සෑම වසරකම ශුද්ධ ලාභයක් ඉපැයීමට සමත් ව ඇත.

ජා. ගො. ප. සංවිධානයෙහි අනුමත සේවක සංඛ්‍යාව පවත්වාගනිමින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල අශ්‍යතාවයන් මත කාර්යමණ්ඩල බඳවාගැනීම් සහ අඩුකිරීම් සිදුකර ඇත. 2021 වසර අවසානයවන විට සමස්ත කාර්යමණ්ඩලය 346 ක් විය.

සාමාන්‍යයෙන් ජා. ගො. ප. සංවිධානය විසින් වර්ෂය ආරම්භයේ දී කර්මාන්තවල අවශ්‍යතා අධ්‍යයනය කර පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන්වලට දායක කරගැනීම සඳහා තම පාර්ශවකරුවන් සමඟ වාර්ෂික කර්මාන්ත උපදේශන හමුවක් පවත්වනු ලබයි. 2021 වසරේ දී පැවති වසංගත තත්ත්වය හමුවේ මෙම හමුව නොපැවැත්විණි. ජා. ගො. ප. සංවිධානය විසින් පූර්ව අත්දැකීම් හා පළපුරුද්ද මත පදනම්

ව පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහනක් සකස්කරන ලදී. ඒ අනුව 2021 වසරතුල රාජ්‍ය ප්‍රතිපාදන ලෙස ලද රු. මිලියන 14.6 ක් පර්යේෂණ කටයුතු සඳහා උපයෝගී කරගත්තා ලද අතර පර්යේෂණ අරමුණු සඳහාවන පර්යේෂණාගාර හා ක්ෂේත්‍ර උපකරණ ප්‍රසම්පාදනය සඳහා රු. මිලියන 3.8 ක් ඵලදායී ලෙස ආයෝජනය කර ඇත. 2021 වසරේ දී පුළුල් විෂය පරාසයක් ආවරණයවන පරිදි පර්යේෂණ හා සංවර්ධන අධ්‍යයනයන් සිදුකර ඇති අතර මෙම අධ්‍යයනයන් පිළිබඳ ව මෙම වාර්තාවෙහි පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් යටතේ දක්වා ඇත.

ජාතික සංවර්ධනය උදෙසා දායකත්වය

නායයෑම් අවදානම් කළමනාකරණය සඳහාවන ජාතික කේන්ද්‍රස්ථානය ලෙස ජා. ගො. ප. සංවිධානය විමර්ශනයන් සහ අවදානම් තක්සේරු අධ්‍යයනයන් සිදුකරනු ලබන අතර උපද්‍රව සහ අවදානම් සිතියම් නිර්මාණය සිදුකරනු ලබයි. මෙම සිතියම් රටතුල භෞතික සැලසුම් සහ සංවර්ධන කටයුතුවල දී භාවිත වේ. ජා. ගො. ප. සංවිධානය විසින් තවදුරටත් නායයෑම් ප්‍රදේශවල නිරීක්ෂණයන් සිදුකරමින් ආයතනය වෙත පැවරී ඇති වැදගත් වගකීමක් ලෙස නායයෑම් පූර්ව අනතුරු හැඟවීම් නිකුත්කිරීම සිදුකරනු ලබයි.

දිස්ත්‍රික්ක 14 ක නායයෑම් අවදානම් සහිත ප්‍රදේශයන් හි ඉදිකිරීම් හෝ සංවර්ධන කටයුතු සඳහා අනුමැතිය ලබාදීම සඳහා ජා. ගො. ප. සංවිධානය විසින් තාක්ෂණික නිර්දේශයන් සහිත නායයෑම් අවදානම් තක්සේරු වාර්තා (LRAR) අදාල පළාත් පාලන ආයතන වෙත නිකුත්කිරීම සිදුකරනු ලබයි. 2021 වසරතුල දී අවශ්‍ය පරීක්ෂණවලින් අනතුරු ව වාර්තා 8685 ක් නිකුත් කිරීමට කටයුතු කර ඇත.

ජාත්‍යන්තර පරිත්‍යාගශීලී නියෝජිතායතන සහ ආයතනයන් බොහෝ විට ජා. ගො. ප. සංවිධානය වෙත ඔවුන්ගේ සහයෝගය ලබාදීම සිදුකරයි. 2021 වසරේ දී 'ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය (JICA) ලෝක බැංකුව, ආසියානු ආපදා පෙරසූදානම්කරණ මධ්‍යස්ථානය (ADPC), නෝර්වීජියානු භූ තාක්ෂණික ආයතනය (NGI) සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) ජා. ගො. ප. සංවිධානය වෙත ඔවුන්ගේ ආධාර අඛණ්ඩ ව ලබාදීමට කටයුතු කර ඇත. මීට අමතර ව එක්සත් ජනපදයේ භූ විද්‍යා සංගමය, බාත් විශ්වවිද්‍යාලය, සල්ෆර්ඩ් විශ්වවිද්‍යාලය සහ හඩර්ස්ෆීල්ඩ් විශ්වවිද්‍යාලය ද ජා. ගො. ප. සංවිධානය වෙත තාක්ෂණික සහයෝගය දක්වා ඇත.

ජා. ගො. ප. සංවිධානය විසින් 2021 වසරේ දී ද ව්‍යූහාත්මක නායයෑම් අවමකිරීමේ කටයුතු දිගටම ක්‍රියාත්මක කරන ලදී. අනතුරුදායක නායයෑම් අවමකිරීම සහ මාර්ග දෙපස බෑවුම් ස්ථායීකරණය, හඳුනාගත් දුම්රිය මාර්ගයන් ආසන්න අස්ථායී බෑවුම් සහ පාසල් අවට බෑවුම් මෙන් ම අවදානමට ලක්විය හැකි පොදු ගොඩනැගිලි ඊට ඇතුලත් විය.

ජා. ගො. ප. සංවිධානය 2021 වසරතුල දී ද රාජ්‍ය සංවර්ධන වැඩසටහන් සඳහා තාක්ෂණිකක සේවා ව්‍යාප්ත කිරීමට අඛණ්ඩ ව දායක විය. මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියෙහි සහ වෙනත් ප්‍රධාන මාර්ගවල සංවර්ධන ව්‍යාපෘතිවයක් වන ලෝක බැංකු ආධාර මත ක්‍රියාත්මකවන වේ දේශගුණික අවබලපෑම් අවමකිරීමේ ව්‍යාපෘතිය (CRIP) යටතේ මහනුවර හා මහියංගන මාර්ගයේ ස්ථාන කීපයක බෑවුම් ස්ථායීකරණ ව්‍යාපෘති සඳහා ජා. ගො. ප. සංවිධානය තම තාක්ෂණික නිපුණතාවය සපයා ඇත. කොළඹ මහනුවර මාර්ගයේ කඩුගන්නාව ප්‍රදේශයේ බෑවුම් අස්ථායීතාවය නිරීක්ෂණය සිදුකිරීම හා අවදානම් තක්සේරුකරණය මහත් ඇගැයීමට ලක්විය.

ජා. ගො. ප. සංවිධානය විසින් 2021 වසරතුල දී ද ගංවතුර හා නායයෑම්වලින් විපතට පත් ප්‍රජාවන් සහ අධි අවදානම් සහිත ප්‍රදේශවල ජීවත්වන ජනතාව සඳහා ආපදාවන්ට ඔරොත්තු දිය හැකි ආරක්ෂිත ප්‍රදේශවල නැවත පදිංචිකිරීමේ වැඩසටහන් සඳහා තම දායකත්වය සපයා ඇත.

ආදායම

ජා. ගො. ප. සංවිධානය විසින් තම මූල්‍ය ම ය අවශ්‍යතා රාජ්‍ය හා පෞද්ගලික අංශයන් හා පොදු මහජනතාව වෙත උපදේශන සේවා සහ පර්යේෂණ සේවා සැපයීම මඟින් උපයන ආදායම් තුලින් ආවරණය කර ගනී. නායයෑම් අවදානම් තක්සේරු කිරීම් ද ගාස්තු මත පදනම්වන සේවාවන් වශයෙන් සිදුකෙරේ. ජා. ගො. ප. සංවිධානය වෙත අවදානම් අවමකිරීමේ ව්‍යාපෘති, උපද්‍රව සිතියම්ගතකරණය, නායයෑම් විශේෂ විමර්ශනයන්, රාජ්‍ය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වෙනත් ව්‍යාපෘති හා විදේශාධාර මත ක්‍රියාත්මක ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සඳහා ප්‍රතිපාදන ලැබේ.



පසුගිය වසර 6 තුල සමස්ත ක්‍රියාකාරී ආදායම



පසුගිය වසර 5 තුල ලාභ අලාභ සටහන්



2021 වසර තුල ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා රාජ්‍ය ප්‍රතිපාදන

බාධක

- ජා. ගො. ප. සංවිධානය මේවන තෙක් විධිමත් පරිදි පනතකින් ස්ථාපිත නොවීම
- රාජ්‍ය ආයතනයක් වශයෙන් උපදේශන සේවා සේවා සඳහා ලංසු තැබීමේ දුෂ්කරතාවයන්
- වැඩකරන කාලය දීර්ඝ කිරීම සඳහාවත සීමා
- වෙනත් සේවායෝජකයන් විසින් ඉහළ ප්‍රතිලාභයක් සහිත ගෙවීම් පිරිනැමීම හේතුවෙන් පළපුරුදු ප්‍රවීන කාර්යමණ්ඩල රඳවාගැනීමේ හා ප්‍රවීන තාක්ෂණික නිලධාරීන් බඳවාගැනීමේ දුෂ්කරතා

ඵලදායීතා ප්‍රවර්ධනය සඳහා මූලපිරීම්

- ✓ ප්‍රධාන විද්‍යුගාර 3 ම ප්‍රතීතනයකර පවත්වාගෙන යාම
- ✓ තාක්ෂණ සහයෝගීතා ව්‍යාපෘති තුලින් ආයතනික ධාරිතා ශක්තිමත් කිරීම
- ✓ ජා. ගො. ප. සංවිධානයේ සැලසුම් ඒකකය ශක්තිමත් කිරීම
- ✓ ඉතා උස් හා විශාල ගොඩනැගිලි සංකීර්ණයන් හි භූ තාක්ෂණික අවදානම තක්සේරු කිරීම් සඳහාවත ධාරිතා වැඩිදියුණු කිරීම

අනාගත සැලසුම්

- ➢ නායයෑම් අවමකරණ සහ ආශ්‍රිත ධාරිතාව අඛණ්ඩ ව වැඩිදියුණු කිරීම
- ➢ උපද්‍රව සිතියම්/අවදානම් පැතිකඩ සකස්කිරීම
- ➢ ආපදා අවමකිරීමේ පියවරක් වශයෙන් ගොඩනැගිලිවල තත්ත්ව තක්සේරුකරණය
- ➢ රසායන උපද්‍රව කළමනාකරණය පිළිබඳ අඛණ්ඩ අධ්‍යයනය
- ➢ කුලී පදනම මත ගොඩනැගිලිවල දැනට පවත්වාගෙන යනු ලබන දිස්ත්‍රික් කාර්යාල සඳහා ගොඩනැගිලි ඉදිකිරීම

කෘතවේදීත්වය

ජා. ගො. ප. සංවිධානයෙහි මෙම සාර්ථකත්වය උදෙසා මාර්ගෝපදේශනය හා මඟපෙන්වීම ලබාදුන් ජාතික ආරක්ෂක හා ආපදා කළමනාකණ ගරු රාජ්‍ය අමාත්‍ය, චමල් රාජපක්ෂ මැතිතුමා, ජාතික හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්, ජා. ගො. ප. සංවිධානයේ අන්තර් කළමනාකරණ කමිටුවේ (IMC) සභාපති, ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න, අතිරේක ලේකම්, මේජර් ජෙනරාල් සුදන්ත රණසිංහ යන මහත්වරුන් වෙත කෘතඥතාවය පලකිරීම සඳහා මම මෙය අවස්ථාව කරගනිමි.

තව ද, ජා. ගො. ප. සංවිධානයේ අන්තර් කළමනාකරණ කමිටුව සහ විගණන කළමනාකරණ කමිටුවෙහි සාමාජිකයින්, අයවැය දෙපාර්තමේන්තුව; මහා භාණ්ඩාගාරය; ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව; විදේශ සම්පත් දෙපාර්තමේන්තුව (ERD); ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය; කාළගුණ විද්‍ය දෙපාර්තමේන්තුව; භූ විද්‍ය හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරුන් සහ අධ්‍යක්ෂ, ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානය (NDRSC) මහත්සේ ඇගැයීමකට ලක්කළ යුතු ය.

මේ අවස්ථාවේ දී අපගේ කෘතවේදීත්වය ජාත්‍යන්තර පාර්ශවකාර ආයතනවන ලෝක බැංකුව, UNDP, JICA, ADPC, NGI, AIIB, USGS, ICL, ජපානයේ SATREPS වැඩසටහන එක්සත් රාජධානියේ සල්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ THINKlab හා භාත් විශ්වවිද්‍යාලය ඇතුළු විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා මූල්‍ය සහ තාක්ෂණික සහයෝගය ලබාදුන් සියලු සහයෝගීත්ව ආයතනයන් වෙත පුදකළ යුතු ය.

ඊට අමතර ව මාගේ අවංක ස්තුතිය අප කෙරෙහි අඛන්ඩ ව විශ්වාසය තැබීම පිළිබඳ ව අපගේ දේශීය පාර්ශවකරුවන් සහ වටිනා පාරිභෝගික භවතුන් වෙත පුද කරමි. ජා. ගො. ප. සංවිධානයෙහි කැපවීම සහිත සේවක ප්‍රජාව වෙත ද මගේ කෘතඥතාවය පුද කරමි. ඔවුන්ගේ එම සහයෝගය නොවන්තට රටතුල පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය තුල කටයුතු ඉටුකිරීමට නොහැකිවනු ඇත. ජා. ගො. ප. සංවිධානයෙහි කොදු නාරටිය බඳු දැනුම, කුලසනාවය හා වෘත්තීය නිපුනතාවය සහිත කැපීපෙනෙන කණ්ඩායම වෙත අපගේ කෘතඥතාවය පුදකර සිටිමි.

එළඹෙන ඉදිරි වසරේ දී ද අපගේ වාර්ෂික ක්‍රියාකාරකම් සැළසුම්වලට අනුකූල ව මෙහෙයුම් හා ඉලක්කයන් ඉටුකරලීමට අප සැවොම සහයෝගයෙන් යුක්ත ව ජා. ගො. ප. සංවිධානයෙහි කාර්යසාධනය තවදුරටත් වර්ධනය උදෙසා ක්‍රියා කරමු. අපගේ කණ්ඩායමෙහි එකිනෙකා කෙරෙහි ඉතාමත් සහයෝගීතාවයෙන් යුතු ව අදහස් හුවමාරු කරගනිමින් විශිෂ්ඨ ප්‍රථිඵල සාක්ෂාත් කරගනු ඇතැ යි අප විශ්වාස කරමු.



ඉංජි. (ආචාර්ය) ආසිරි කරුණාවර්ධන
අධ්‍යක්ෂ ජනරාල්

දැක්ම, මෙහෙවර සහ ඉලක්කයන්

දැක්ම

ආපද ප්‍රත්‍යාස්ථික හා තිරසාර නිර්මිත සුරක්ෂිත පරිසරයක වෙසෙන ජනතාවක්

මෙහෙවර

ආපද අවදානම අවමකිරීම උදෙසා ඔරොත්තුදීමේ හැකියාව ගොඩනැගීම තුලින් සැමට සුරක්ෂිත හා තිරසාර නිර්මිත පරිසරයක්

ඉලක්කයන්

- ඉලක්කය 1: ආපද අවදානම් තක්සේරුකිරීමේ විෂයයන් හා විෂය ක්ෂේත්‍ර තුල තාක්ෂණික විශිෂ්ඨත්වය කරා ළඟාවීම
- ඉලක්කය 2: ආපද අවදානම අවමකිරීම (DRR) හි අදාල විෂයයන් හා විෂය ක්ෂේත්‍ර තුල නෛතික තත්ත්වය සහ ව්‍යවස්ථාපිත බලතල ළඟාකරගැනීම.
- ඉලක්කය 3: පාරිසරික, භූ තාක්ෂණ ඉංජිනේරු, ගොඩනැගිලි ද්‍රව්‍ය, ප්‍රත්‍යාස්ථික පාරිසරික සැළසුම්කරණය සහ ප්‍රත්‍යාස්ථික ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ ප්‍රතීතනය ලත් පරීක්ෂණ සහ තාක්ෂණික සේවා සපයන ඉහලම ජාතික ආයතනයක් බවට පත්වීම
- ඉලක්කය 4: ආපද අවදානම අවමකිරීම (DRR) සහ ආපදාවන්ට ඔරොත්තුදීමේ හැකියාව සංවර්ධනය පිළිබඳ තාක්ෂණය හා නවෝත්පාදන ක්ෂේත්‍රවල පර්යේෂණ හා සංවර්ධන විශිෂ්ඨත්වය ළඟාකරගැනීම.
- ඉලක්කය 5: ජාතික කළාපීය සහයෝගීතා සම්බන්ධතා මඟින් ආපද අවදානම අවමකිරීම (DRR) දිරිගැන්වීම හා පවත්වාගෙන යාම සඳහා ආපද ප්‍රත්‍යාස්ථික විද්‍ය හා තාක්ෂණය යොදාගැනීම.
- ඉලක්කය 6: ඵලදායී ලෙස ආපද අවදානම අවමකිරීම සඳහා අදාල විෂයයන් හා විෂය ක්ෂේත්‍රය තුල ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීම
- ඉලක්කය 7: ආපද අවදානම අවමකිරීමේ ඵලදායී ක්‍රියාත්මකවීම උදෙසා ජා. ගො. ප. සංවිධානයෙහි මූල්‍ය තිරසාර බව ළඟාකර ගැනීම.
- ඉලක්කය 8: නායයෑම් අවදානම කළමනාකරණය සඳහා විශිෂ්ඨත්වයෙන් යුත් ජාතික කේන්ද්‍රස්ථානය බවට පත්වීම.
- ඉලක්කය 9: දේශගුණික සවිඥානික පූර්ව අනතුරු හැඟවීමේ තාක්ෂණය තුලින් ආපදාවන්ට ඔරොත්තුදීමේ හැකියාව ගොඩනැගීම
- ඉලක්කය 10: පරිසරය මත පදනම් ආපද අවදානම් අවමකිරීමේ තාක්ෂණය තුලින් ආපදාවන්ට ඔරොත්තුදීමේ හැකියාව ගොඩනැගීම
- ඉලක්කය 11: ප්‍රජා විද්‍යව පදනම් කරගත් ආපද අවදානම අවමකිරීමේ ක්‍රියාවලීන් තුලින් ආපදාවන්ට ඔරොත්තුදීමේ හැකියාව ගොඩනැගීම.
  ඉලක්කය 12: පුනරුත්ථාපනය සහ නැවත ගොඩනැගීමේ තාක්ෂණය තුලින් ආපදාවන්ට ඔරොත්තුදීමේ හැකියාව ගොඩනැගීම

ජා. ගො. ප. සංවිධානයේ කළමනාකරණය

විෂයභාර ගරු අමාත්‍ය
චමල් රාජපක්ෂ
ජාතික ආරක්ෂක, හා ආපදා කළමනාකරණ
රාජ්‍ය අමාත්‍ය

වර්තමානයේ දී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ පරිපාලන, මූල්‍ය හා කළමනාකරණ කටයුතු මෙහෙයවීමට සහ මාර්ගෝපදේශකත්වය සැපයීම සඳහා රේකිය අමාත්‍යාංශයේ ලේකම් සභාපතීත්වය දරණ කැබිනට් අනුමැතිය ලත් අන්තර් කළමනාකරණ කමිටුවක් පත්කර ඇත.

අන්තර්වාර කළමනාකරණ කමිටුව (IMC)

ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න (සභාපති) ලේකම්, ජාතික ආරක්ෂක, ස්වදේශ කටයුතු සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය	**එම්. ඒ. තන්දනී මහත්මිය** අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ජාතික අයවැය දෙපාර්තමේන්තුව
මේජර් ජෙනරල් සුදත්ත රණසිංහ අධ්‍යක්ෂ ජනරාල් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය	**ඉංජි. අරුණ ගමගේ** අධ්‍යක්ෂ Consulting Engineers & Architects Associated (Pvt) Ltd
ආචාර්ය සුගත් යාලේගම මයා අතිරේක ලේකම් (ප්‍රතිපත්ති හා පාලන) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය	**එච්. යූ. ආර්. ෆොන්සේකා මයා** ප්‍රධාන ගණකාධිකාරී ජාතික ආරක්ෂක, ස්වදේශ කටයුතු සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය
ඒ. කේ. කරුණානායක මයා අධ්‍යක්ෂ ජනරාල් කාලගුණ දෙපාර්තමේන්තුව	**ඉංජි. (ආචාර්ය) ආසිරි කරුණාවර්ධන** අධ්‍යක්ෂ ජනරාල් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

විගණන හා කළමනාකරණ කමිටුව

එම්. ඒ. තන්දනී මහත්මිය (සභාපති) අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ජාතික අයවැය දෙපාර්තමේන්තුව	**එච්. යූ. ආර්. ෆොන්සේකා මයා** (සාමාජික) ප්‍රධාන ගණකාධිකාරී ජාතික ආරක්ෂක, ස්වදේශ කටයුතු සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය	**ඉංජි. අරුණ ගමගේ** (සාමාජික) අධ්‍යක්ෂ Consulting Engineers & Architects Associated (Pvt) Ltd

නිරීක්ෂක

එල්. ජී. බී. සඳමාලි මහත්මිය වැ. බ. විගණන අධිකාරී	**ආර්. ඒ. එන්. ඩී. රණතුංග මහත්මිය** ප්‍රධාන අභ්‍යන්තර විගණක ජාතික ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය

සහභාගීත්වය

ඉංජි. (ආචාර්ය) ආසිරි කරුණාවර්ධන අධ්‍යක්ෂ ජනරාල් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය	**කුමුදු රත්දෙනි මහත්මිය** අධ්‍යක්ෂ (මුදල්) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය	**එච්. එල්. රුවන්තිලක මයා** අභ්‍යන්තර විගණක ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

ආයතනික ව්‍යුහය



ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

ඉංජිනේරු (ආචාර්ය) ආසිරි කරුණාවර්ධන	අධ්‍යක්ෂ ජනරාල්
කේ. සී. සුගතපාල මයා	අධ්‍යක්ෂ, මානව ජනාවාස සැලසුම්කරණය හා පුහුණු අංශය
සරත් ප්‍රේමසිරි මයා	අධ්‍යක්ෂ, පාරිසරික අධ්‍යයන හා සේවා අංශය
කිත්සිරි එන්. බණ්ඩාර මයා	අධ්‍යක්ෂ, භූ තාක්ෂණික ඉංජිනේරු හා පරීක්ෂණ අංශය
සුනේත්‍රා මුතුරත්න මිය	අධ්‍යක්ෂ, ගොඩනැගිලි ද්‍රව්‍ය පර්යේෂණ හා පරීක්ෂණ අංශය
ධම්මිකා කහඟේන්ගොඩ මෙවි	අධ්‍යක්ෂ, ව්‍යාපෘති කළමනාකරණ අංශය
ආචාර්ය ගාමිණී ජයතිස්ස මයා	වැ. බ. අධ්‍යක්ෂ, නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ අංශය
කුමුදු රන්දෙනිය මිය	අධ්‍යක්ෂ, මුල්‍ය
සරත් කුරේ මයා	වැ. බ. අධ්‍යක්ෂ, පරිපාලන
සෙනරත් බණ්ඩාර මයා	ව්‍යාපෘති අධ්‍යක්ෂ, (PMU), ස්ථායීකරණ ක්‍රමවේද මහින් නායයෑම් අවදානම අවමකිරීමේ ව්‍යාපෘතිය

වැදගත් සිදුවීම් (මෙහෙයුම් විශේෂ අවස්ථා)



2021 වසර තුල ජා. ගො. ප. සංවිධානය ශ්‍රී ලංකා සහ ජපාන යන රජයයන් දෙකෙහි ආධාර මත ජාත්‍යන්තර නායයෑම් සම්මේලනය හා බොහෝ වැදගත් පාර්ශවකරුවන්ගේ මැදිහත්වීමෙන් වසර පහක ප්‍රධාන අධ්‍යයනය වන 'ශ්‍රී ලංකාවෙහි වර්ෂාව මත ප්‍රේරණයවන වේගවත් හා දිගුදුර චලනයන් සහිත නායයෑම් පිළිබඳ පූර්ව අනතුරු හැඟවීමේ තාක්ෂණය සංවර්ධනය කිරීම'අඛණ්ඩ ව ක්‍රියාත්මක කරන ලදී. ජා. ගො. ප. සංවිධානය විසින් 2019 වසරේ දී ආරම්භ කරන ලද 'ස්ථායීකරණ ක්‍රමවේද මඟින් නායයෑම් අවදානම අවමකිරීමේ ව්‍යාපෘතිය' (RLVMMP) ක්‍රියාත්මක කිරීම අඛණ්ඩ ව සිදුකරන ලදී. ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීමේ අරමුණින් ජාත්‍යන්තර පාර්ශවකාර ආයතන සමඟ (NILIM, SABO, USGS සහ ThinkLab ආදී.,) ආරම්භකරන ලද අනෙකුත් ව්‍යාපෘතීන් ද කොවිඩ් 19 වසංගතය හමුවේ පැවති අයහපත් තත්ත්වයන් යටතේ වුව ද සැළකිය යුතු ප්‍රගතියක් ලබා ඇත.

ජා. ගො. ප. සංවිධානය ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත නායයෑම් පූර්ව අනතුරු හැඟවීමේ මධ්‍යස්ථානයේ පූර්ව අනතුරු හැඟවීම් නිකුත්කිරීමේ කටයුතුවල ඵලදායීතාවය උදෙසා සංවිධානය විසින් නායයෑම් ආශ්‍රිත ප්‍රදේශවල ස්වයංක්‍රිය වර්ෂාමාපක ජාලය ශක්තිමක් කිරීම සහ භූමි චලනයන් ග්‍රාහක උපකරණ ජාලය ශක්තිමත් කිරීම යන කටයුතු සිදුකර ඇත. මෙම ජාලයන් ව්‍යාප්ත කිරීමේ හා අවම පිරිවැයක් යටතේ පවත්වාගෙන යාම සඳහා උත්සාහයක් ලෙස ස්වයංක්‍රිය වර්ෂාමාපක සහ ආශ්‍රිත උපකරණ දේශීය වශයෙන් නිෂ්පාදනය සංවර්ධනය කිරීම අඛණ්ඩ ව ක්‍රියාත්මක කර ඇත.

පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් ජා. ගො. ප. සංවිධානයේ පර්යේෂණ කමිටුවේ මාර්ගෝපදේශකත්වයෙන් අඛණ්ඩ ව සිදුකරන ලදී. 2021 දෙසැම්බර් මාසයේ දී ජා. ගො. ප. සංවිධානයේ 11 වැනි වාර්ෂික පර්යේෂණ සමුළුව පවත්වන ලද අතර එහිදී බොහෝ පර්යේෂකයන් ඔවුන්ගේ පර්යේෂණ ප්‍රථිඵලයන් එළිදක්වන ලදී. සියලු පර්යේෂණ පත්‍රිකාවන් සමුළුව අතරතුර දී ප්‍රකාශයට පත්කරන ලදී.

ජා. ගො. ප. සංවිධානය රේඛීය අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ අංශයෙහි පර්යේෂණ හස්තය මෙන් ම එකම තාක්ෂණික ආයතනය ද වේ. නවීන පහසුකම්වලින් ශක්තිමත් බහුවිධ විෂයපථයන්ගෙන් යුත් තාක්ෂණික අංශයන් හි ධාරිතාවයන් ඒකාබද්ධ ව භාවිතා කරමින් රටතුල බොහොමයක් ගැටලු සඳහා විසඳුම් සැපයීමට ජා. ගො. ප. සංවිධානය සමත් ව ඇත. ජා. ගො. ප. සංවිධානයෙහි විශේෂඥතාවය වර්තමානයෙහි ප්‍රධාන වශයෙන් භූ තාක්ෂණික ඉංජිනේරු, ගොඩනැගිලි ද්‍රව්‍ය තාක්ෂණය, මානව ජනාවාස සැලසුම්කරණය, පාරිසරික කළමනාකරණය, නායයෑම් ආවදනම් තක්සේරුකරණය සහ ව්‍යාපෘති කළමනාකරණය යන ක්ෂේත්‍රයන් හි තාක්ෂණික සේවා ලෙස පිරිනමනු ලැබේ. විශේෂයෙන් නායයෑම් අවමකිරීමේ තාක්ෂණය, භූමියෙහි ගිලාබැසීම් හඳුනාගැනීම, ආපදවන්ට ඔරොත්තුදීමේ හැකියාවන් ප්‍රවර්ධනය කිරීම සහ නියඟයට අනුවර්තනයවීම වැනි මතුවෙමින් පවතින ගැටලු පිළිබඳ ජා. ගො. ප. සංවිධානය විශේෂඥතාවයක් උසුලනු ලබයි.

සමාලෝචන වර්ෂය තුල ජා. ගො. ප. සංවිධානය වෙත පැවරෙන ලද හා වාර්ෂික ක්‍රියාකාරකම් සැලැස්මෙහි සඳහන් විශේෂිත කාර්යයන් ක්‍රියාවට නංවා ඇත.

රාජ්‍ය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති

නායයෑම් ආපදා කළාප සිතියම්ගත කිරීමේ ව්‍යාපෘතිය (LHMP)

1985 වසරේ දී සිදුවූ බරපතල නායයෑම්වලින් පසුව ජා. ගො. ප. සංවිධානය වෙත නායයෑම් විමර්ශන සහ අදාල අධ්‍යයනයන් පවරා ඇත. ඉන් අනතුරු ව ජා. ගො. ප. සංවිධානය විසින් නායයෑම් හඳුනාගැනීමේ සහ සිතියම්ගතකිරීමේ කටයුතු ආරම්භ කළ කරන අතර එහි ප්‍රතිඵලයක් ලෙස නායයෑම් අවදානම් කළාප සිතියම්ගතකිරීමේ ව්‍යාපෘතිය (LHMP) 1992 වසරේ දී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි සහාය ඇති ව දියත්කරන ලදී. මෙම ව්‍යාපෘතිය දැනට රජයේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මකවන අතර එහි ප්‍රධාන ප්‍රතිඵලය වශයෙන් (i) 1:50,000 පරිමාණයේ සිතියම් සමස්ත වර්ග කි. මී. 32,593.1 ක් ආවරණය වන පරිදි දිස්ත්‍රික්ක 13 ක සහ (ii) 1:10,000 පරිමාණයේ සිතියම් සමස්ත වර්ග කි. මී. 8,960 ක ප්‍රමුඛතා කළාප ආවරණය වන පරිදි සිතියම්ගත කර ඇත.

2021 වසර තුල ව්‍යාපෘතිය සඳහා රජය මඟින් රු. මිලියන 26.6 ක ප්‍රතිපාදන ලබාදී ඇති අතර එහි ප්‍රථිඵල ලෙස වර්ග කි. මී. 40 බැගින් ආවරණය වන පරිදි 1:10,000 පරිමාණයේ සිතියම්පත් 14 ක් මහනුවර සහ නුවරඑළිය දිස්ත්‍රික්ක සඳහා සකස්කර ඇත. මෙම වර්ෂයේ 1:10,000 පරිමාණයේ සමස්ත ආවරණ කළාපය මේවන විට වර්ග කි. මී. 560 ඉක්මවා ඇත.

මෙම ව්‍යාපෘතිය මඟින් සකස්කරන ලද සිතියම් නායයෑම් පූර්ව අනතුරු හැඟවීම් නිකුත්කිරීම සහ ආපදා තක්සේරු කිරීම උදෙසා නායයෑම් විමර්ශන කටයුතු කිරීම සඳහා ද, නායයෑම් අවදානම් තක්සේරුකිරීමේ වාර්තා නිකුත්කිරීම (LRAR) සඳහා ද, නාය අනතුරු සිදුවිය හැකි භූමි හඳුනාගැනීමේ ප්‍රමුඛතාවය අනුව අවමකිරීමේ ව්‍යුහමය ක්‍රමවේද යෙදීමේ කාර්යයන් සඳහා ද භාවිතා කරනු ලැබේ. තව ද, විවිධ ආයතන මඟින් ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ සැලසුම්කරණ කටයුතු සඳහා ද මෙම සිතියම් භාවිතා කරනු ඇත. (www.nbro.gov.lk).



Hazard Zonation Mapping Area





රූපය.1 ශ්‍රී ලංකාවේ නායයෑම් ආපදා කලාප ක්‍රියාත්මක කරන ප්‍රදේශ
රූපය.2 ශ්‍රී ලංකාව තුළ නායයෑම් උපද්‍රව කලාප බෙදීයාම, පරිමාණය 1:50,000
රූපය.3 නායයාමේ උපද්‍රව කලාප සිතියමේ තියැදිය, පරිමාණය 1:50,000

නායයෑම් විශේෂ විමර්ශන (SPI)

නායයෑම් නිසා අසල්වැසි මානව ජනාවාස, යටිතල පහසුකම් සහ වතු ආශ්‍රිත ව පවතින අවදානම් හඳුනාගැනීමේ සහ ජීවිත, දේපලවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා නායයෑම් සම්බන්ධ විශේෂ විමර්ශන පවත්වා කඩිනමින් නිර්දේශ ලබාදෙන ලෙස ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම්වරුන් මෙන් ම වෙනත් රාජ්‍ය ආයතනවල නිලධාරීන් විසින් ජා. ගො. ප. සංවිධානය වෙතින් ඉල්ලීම් සිදුකෙරේ. 2021 වසරේ දී එබඳු නායයෑම් විශේෂ විමර්ශන 5783 ක් සිදුකර ඇත. ඒ සඳහා මහාභාණ්ඩාගාරය විසින් රු. මිලියන 78.0 ක ප්‍රතිපාදන සපයා ඇත.

නායයෑම් අවදානම තක්සේරුකර වාර්තා නිකුත්කිරීමේ ක්‍රියාවලිය (LRAR)

ජා. ගො. ප. සංවිධානය විසින් පළාත් පාලන අධිකාරීන් වෙත නායයෑම් අවදානම් තක්සේරු වාර්තා නිකුත්කිරීම සිදුකරන අතර ඒ තුලින් නායයෑම් සිදුවීමේ හැකියාව සහිත ප්‍රදේශවල ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු සඳහා අවසර ලබාදෙන්නේ ද නැද්ද යන්න පිළිබඳ ව නිර්දේශ ලබාදීම ද සිදුකෙරේ. නායයෑම් අවදානම් තක්සේරු වාර්තා නිකුත්කිරීම මුලින් ම 2011 වසරේ මාර්තු මස ආරම්භ වූ අතර එතැන් සිට 2021 දෙසැ. 31 වන විට ඉල්ලුම්පත් 98,000 කට අධික සංඛ්‍යාවක් ලැබී ඇත. 2021 වසර තුල දී අනුමැතිය ලබාදී ඇති සංඛ්‍යාව 8685 වන අතර මෙම කාලය තුල ඉල්ලුම් පත් 61 ක් ප්‍රතික්ෂේප කිරීම සිදුවී ඇත. ජා. ගො. ප. සංවිධානය විසින් අවශ්‍ය විමර්ශනයන් සිදුකිරීම හා වාර්තා නිකුත්කිරීම සඳහා නාමික ගාස්තුවක් අයකෙරේ. 2021 වසරේ මෙම ක්‍රියාවලියෙහි පුනරාවර්තන වියදම් ආවරණය කරනු පිණිස මහාභාණ්ඩාගාරයෙන් රු. මිලියන 35.0 ක ප්‍රතිපාදන සපයනු ලද අතර අතිරික්ත පිරිවැය ආයතනික සමාජ වගකීමක් ලෙස ආයතනික ආදායමෙන් දරා ඇත.

වගුව : 2011 මාර්තු මස ආරම්භයේ සිට නායයෑම් අවදානම් තක්සේරු වාර්තා නිකුත්කිරීමේ විස්තර

Progress of the Issuance of Landslide Risk Assesment Certificates for Construction and Development Activities in Landslide Prone Areas (LRAB & LRAD)

නායයෑම් අවදානම් සහිත ප්‍රදේශ වල ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු සඳහා නායයෑම් යෝග්‍යතා

(01.03.2011 - 31.12.2021)

අනු අංකය Item No.	District දිස්ත්‍රික්කය	01.03.2011 - 31.12.2021				01.01.2021 - 31.12.2021				Total applications pending (අතිරික්ත ඉල්ලුම්පත් සංඛ්‍යාව) {1-(2+3+4)}	Pending Application Details (අතිරික්ත ඉල්ලුම්පත් පිළිබඳ විස්තර)		
		Applications Received (ලැබූ ඉල්ලුම් පත්) (1)	Permission granted (අනුමැතිය ලබාදුන්) (2)	Permission not granted (අනුමැතිය ලබා නොදුන්) (3)	Applications Cancelled due to other reasons (වෙනත් හේතූන් මත අවලංගු කරන ලද ඉල්ලුම්පත්) (4)	Applications Received (ලැබූ ඉල්ලුම් පත්)	Permission granted (අනුමැතිය ලබාදුන්)	Permission not granted (අනුමැතිය ලබා නොදුන්)	Applications Cancelled due to other reasons (වෙනත් හේතූන් මත අවලංගු කරන ලද ඉල්ලුම්පත්)		Pending For initial Investigation / report preparation (මූලික පරීක්ෂණ සඳහා/වාර්තා සැකැසීම)	Referred to revisit / detailed inspection (වැඩිදුර අධ්‍යයනයට යොමු කිරීම සඳහා)	Details Pending from Client (ඉල්ලුම්කරුගෙන් අදාල ලියකියවිලි ලැබෙන තෙක්)
1	Kandy	21,537	19,321	316	1,667	1,535	1,707	3	275	233	71	2	160
2	Matale	9,224	9,166	17	32	719	841	0	0	9	9		
3	Nuwaraeliya	8,224	7,802	83	181	750	597	19	130	158	51	0	107
4	Badulla/Monaragala	13,364	12,726	221	320	1,388	1,398	21	10	97	87	4	6
5	Kagalle	12,231	11,589	67	440	895	809	5	8	135	98	0	37
6	Rathnapura	12,748	11,105	46	1,513	1,361	1,276	8	113	84	84		
7	Kalutara	1,273	1,221	11	30	168	167	4	1	11	11	0	0
8	Galle	17,195	17,144	9	24	1,655	1,700	1	1	18	18		
9	Matara/H'tota	2,338	2,327	5	6	116	121	0	0	0	0		
10	Kurunagala	44	43	0	1	18	18	0	1	0	0	0	0
11	Colombo/Gampaha	51	51	0	0	51	51	0	0	0	0	0	0
එකතුව/Total		**98,229**	**92,495**	**775**	**4,214**	**8,656**	**8,685**	**61**	**539**	**745**	**429**	**6**	**310**

නායයෑම් අවම කිරීමේ වැඩසටහන් (රාජ්‍ය අරමුදල්)

නායයෑම් අවදානම් සිතියමිකරණ වැඩසටහන (LHMP) හා නායයෑම් විශේෂ විමර්ශන (SPI) මඟින් අවමකරණ ක්‍රියාමාර්ග අවශ්‍ය යැයි හඳුනාගත් ප්‍රධාන හා ප්‍රමුඛතාවය සහිත නායයෑම් 2 ක් අවමකරණ කටයුතු සහ වෙනත් බෑවුම් වැඩිදියුණු කිරීම් ස්ථාන 9 ක් පහත සඳහන් පරිදි රාජ්‍ය භාණ්ඩාගාරයෙන් ලද අරමුදල් භාවිතයෙන් ක්‍රියාවට නංවා ඇත.

අංකය	නායයෑම් අවමකිරීම, බෑවුම් ස්ථායීකරණ ව්‍යාපෘතිය	සමස්ත පිරිවැය (රු. මි.)
1	නුවරඑළිය දිස්ත්‍රික්කයේ මලපට්ටාව අස්ථාවර බෑවුම් ස්ථාවර කිරීම	76.90
2	අවිස්සාවේල්ල, කොටහැරකන්ද නායයෑම් අවමකිරීම	52.04
3	දළඳ මාලිගාව, අස්ගිරි විහාරය, තලවකැලේ නාවලපිටිය මාර්ගයෙහි වර්ධනකුඹුර, පස්සර ශක්ති තේ කර්මාන්ත ශාලාව, අම්බල්ගොඩ සුතාමි ගම්මානයෙහි බෙවරින් සිංහ සමාජය, කළුතර ශ්‍රී ධර්මවිජය පිරිවෙන, කළුතර ආනන්දරාම විහාරය සහ වෙල්ලක්ක, වැලිගම, අංක 129 යන ස්ථානයන් හි භූ තාක්ෂණික විමර්ශන සහ නායයෑම් හා අස්ථාවර බෑවුම්වල ඉංජිනේරු ම ය නිර්මාණ සහිත නිවැරදි කිරීම්	9.26
	එකතුව	**138.20**

නායයෑම් අවදානම සහිත ප්‍රදේශ සඳහා අවදානම් පැතිකඩක් සැකසීම



නායයෑමක් සිදුවුවහොත් අපේක්ෂිත ජීවිත හා දේපල හානි ඇතිවීමේ විභවයන් පිළිබඳ ව නායයෑම් අවදානම් සිතියම් මඟින් පෙන්නුම් කෙරේ. නායයෑම් ආපදා කලාප සිතියම් හා මානව ජනාවාස සිතියම් ඒකාබද්ධ කිරීම මඟින් නායයෑම් අවදානම් සිතියම් සංවර්ධනය කර ඇත. මෙම සිතියම් නායයෑම්වලට ලක්විය හැකි ඉඩම් සංවර්ධනය හා භාවිතය මෙන් ම ආයෝජනයන් සඳහා මඟපෙන්වන මෙවලමක් ලෙස භාවිතා කිරීමට හැකිවනු ඇත. පස් අවුරුදු වැඩ සැලැස්මකට ඇතුලත් පහත සඳහන් ක්‍රියාකාරකම් 2021 වසරතුල දී ඉටුකොට ඇත.

- ග්‍රාම නිලධාරී කොට්ඨාශ 100 ක් තුල ප්‍රමුඛතා නායයෑම් අවමකිරීමේ ස්ථාන හඳුනාගැනීම
- කළුතර දිස්ත්‍රික්කය තුල ප්‍රජා ආපදා කළමනාකරණ කමිටු 30 ක් ස්ථාපනය කිරීම
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ අවදානම් පැතිකඩ සංවර්ධනය සිදුකිරීම (ගාල්ල, මාතර, මහනුවර, මාතලේ, රත්නපුර දිස්ත්‍රික්කවල)
- උපද්‍රව සිතියම් 205 ක් සඳහා ග්‍රාමනිලධාරී කොට්ඨාශ මට්ටමේ නායයෑම් නිරාවරණය සිතියම් සකස්කිරීම
- නායයෑම් අවදානම් තොරතුරු ද්වාරයෙහි දත්ත ප්‍රකාශයට පත්කිරීම, ද්වාරය භාවිතා කිරීම පිළිබඳ අදාල බලධාරීන් සහ පාර්ශවකරුවන්හට පුහුණුව ලබාදීම සහ දැනුවත් කිරීම (DMC, NDRSC, නායයෑම් අවදානම් දිස්ත්‍රික්ක 10 ක දිස්ත්‍රික් ලේකම් කාර්යාල (නුවරඑළිය සහ කළුතර වැඩසටහන් සම්පූර්ණයෙන් නිමකර ඇත.)

ගොඩනැගිලි තක්සේරුකරණය සහ තත්ත්ව වාර්තාකරණය සඳහා ක්‍රමෝපාය සංවර්ධනය කිරීම

රජය සතු පොදු ගොඩනැගිලි සහ මහජනතාව බහුලව භාවිතාකරන අනෙකුත් ගොඩනැගිලි හිමිකරුවන් විසින් නිර්මිත කාලයකට වඩා පැරණිවීම, ඉපැරණිභාවය නිසා පරිහානියට පත් ව ඇති බවක් විද්‍යමානවීම, දුර්වල මට්ටමේ ව්‍යුහාත්මක අඛණ්ඩතාවයක් සහිතවීම, ව්‍යසනයක දී හෞතික හානිවලට ලක් ව තිබීම, දුර්වල නඩත්තුකරණය හෝ අවට පරිසරයේ සිදුවන ඉදිකිරීම්වල බලපෑම් වැනි හේතූන් මත ජා. ගොෙ. ප. සංවිධානය වෙතින් විමර්ශනයක් පවත්වා තාක්ෂණික/ව්‍යුහාත්මක ඇගැයීම් වාර්තාවක් ලබාගැනීමත් ඒ සමඟ ඉදිරිපත්වන නිර්දේශ ක්‍රියාත්මක කිරීමත් සිදුකෙරේ. ජා. ගොෙ. ප. සංවිධානය විසින් මේ සඳහා ක්‍රමවේදයක් ස්ථාපනය කර ඇති අතර 2021 වසරතුල ගොඩනැගිලි 116 ක ව්‍යුහාත්මක ඇගැයීම් හා විමර්ශනයන් සිදුකොට ඇත.

තත්‍යකාලීන නායයෑම් පුරෝකථනය සහ පූර්ව අනතුරු ඇගැයීම් හැකියාව වැඩිදියුණු කිරීම



නායයෑම් ප්‍රේරණය බහුල වශයෙන් සිදුවන්නේ අධික තීව්‍රතාවයකින් යුත් වර්ෂාපතනයක් සමඟ පාංශු තෙතමනය වැඩිවීම හේතුවෙන් වීම නිසා ජා. ගොෙ. ප. සංවිධානය ඵලදායී නායයෑම් පූර්ව අනතුරු හැඟවීම් නිකුත්කිරීම සඳහා නායයෑම් අවදානම් ප්‍රදේශවල වර්ෂාපතනය නිරීක්ෂණය සඳහා ස්වයංක්‍රීය වර්ෂාමාන ජාලයක් පවත්වාගෙන යනු ලබයි. ජා. ගොෙ. ප. සංවිධානයෙහි නායයෑම් පූර්ව අනතුරු ඇඟවීම් මධ්‍යස්ථානයෙහි විද්‍යඥයින්, කාලගුණ විද්‍ය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන කාලගුණ පුරෝකතනයන් හා ස්වයංක්‍රීය වර්ෂාමාන පද්ධතිය වෙතින් ලබාගන්නා වර්ෂාපතන දත්තයන් විශ්ලේෂණය තුලින් ආපද කළමනාකරණ මධ්‍යස්ථානයේ හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය සමඟ ඒකාබද්ධ ව පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කරනු ලබයි. 2021 වසරේ ස්වයංක්‍රීය වර්ෂාමාපක 29 ක් ජාලයට එක් කිරීමත් සමඟ මේ වන විට සමස්ත ස්වයංක්‍රීය වර්ෂාමාපක සංඛ්‍යාව 329 දක්වා ඉහළ ගොස් ඇත.





ශ්‍රී ලංකාව තුල රසායනික ආපද අවදානම පිළිබඳ විධිමත් තක්සේරුකරණය

කර්මාන්ත සඳහා ආපද කළමනාකරණ සැලසුමක අවශ්‍යතාවය අවබෝධ කරගනිමින් (විශේෂයෙන් අන්තරායකාරී රසායනික භාවිතා කෙරෙන කර්මාන්ත) ජා. ගොෙ. ප. සංවිධානය විසින් 'ශ්‍රී ලංකාව තුල රසායනික ආපද අවදානම පිළිබඳ විධිමත් තක්සේරුකරණය' ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත. මෙම ව්‍යාපෘතිය තුලින් රසායනික විපත්/අනතුරු තත්ත්වයන්, ඇවුළුම් සාධක නිර්ණය කිරීම සහ නිවාරණය ක්‍රියාමාර්ග හා නිවැරදිකිරීම් යෝජනා කිරීම ඉලක්කගත ව ඇත. මෙම අධ්‍යයනයන් මඟින් රසායනික විපත් සිදුවීම වැලැක්වීම හෝ අවමකිරීම සඳහා ප්‍රතිපත්ති රාමුවක් සංවර්ධනය කිරීමට සහ ශ්‍රී ලංකාව තුල ආරක්ෂිත කාර්මික පරිසරයක් වෙනුවෙන් දැනුවත්කිරීම සිදුකිරීමට ජා. ගොෙ. ප. සංවිධානය අපේක්ෂා කරයි.



මෙම ව්‍යාපෘතිය යටතේ ජා. ගො. ප. සංවිධානය විසින් ශ්‍රී ලංකාව තුල රසායනික විපත් අවදානම ඇගයීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සංවර්ධනය කර ඇත. මෙම ක්‍රමවේදය දීප ව්‍යාප්ත ව බොහෝ කර්මාන්ත සඳහා භාවිතා කිරීමට යෝග්‍ය වේ. මේ මඟින් විශේෂිත රසායනයන් හි මූලික ගබඩාකරණයේ සිට ජනතයවන අනතුරුදායක අපද්‍රව්‍ය බැහැරකිරීම දක්වා අවදානම ඇගයීමට ලක්කෙරෙනු ඇත. වැඩසටහනෙහි කොටසක් ලෙස රසායනික දත්ත වේදිකාවක් සහ කාර්මික දත්ත වේදිකාවක් සංවර්ධනය කර පවතින දත්ත සමඟ යාවත්කාලීන කර ඇත. රසායනික දත්ත වේදිකාවට අන්තරායකර රසායනිකයේ භෞතික හා රසායනික ලක්ෂණ සහ එහි නොගැලපෙන තත්ත්වයන් ද ඇතුලත් වේ. හදිසි සිදුවීමක දී මූළික ඉවත්කිරීමේ කලාප හඳුනාගැනීමට සහ ආදර්ශනය කිරීමට අවශ්‍ය දත්තයන් ද එහි අන්තර්ගත ව ඇත. කර්මාන්ත දත්ත වේදිකාව තුල කාර්මික දත්ත ගබඩාකිරීම සිදුකරයි. එක් එක් කර්මාන්තයේ භාවිතාවන රසායනික ද්‍රව්‍යවල අනතුරුදායක බව අනුව කර්මාන්ත සඳහා ප්‍රමුඛතාවය ලබාදෙනු ඇත. කාර්මික දත්ත සමුදයක් ප්‍රතිවිපාක පුරෝකථනය සඳහා මෙන් ම රසායනික ව්‍යසනයක දී ක්ෂණික ක්‍රියාමාර්ග ගැනීම සඳහා ද උපකාරී වේ. ජංගම දුරකතන යෙදවුමක් ඔස්සේ අවශ්‍ය දත්ත රැස්කිරීම සිදුකෙරෙනු ඇත.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය යටතේ අවශ්‍ය යටිතල පහසුකම් සහිත ව 'රසායනික ආපද කළමනාකරණය කාර්යසාධක බලකාය' පිහිටුවීමට සැලසුම් කර ඇත. එය ශ්‍රී ලංකාවේ ඕනෑම රසායනික ආපද අවදානමක් තක්සේරු කිරීමට සහායවීම සඳහා ක්‍රියාත්මක වනු ඇත.

පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන්

2021 වසරේ දී ජා. ගො. ප. සංවිධානය වෙත රාජ්‍ය පර්යේෂණ ප්‍රතිපාදන වශයෙන් රු. මිලියන 14.6 ක් හිමි විය. ඉදිකිරීම් කර්මාන්තයේ පර්යේෂණ අවශ්‍යතා අධ්‍යයනය සඳහා වන තාක්ෂණික උපදේශන වැඩමුළුව 2021 වසරේ දී කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් නොපවත්වන ලදී. පසුගිය අත්දැකීම් පාදක කරගනිමින් 2021 වසර සඳහා උචිත පර්යේෂණ හා සංවර්ධන වැඩසටහනක් සම්පාදනය කෙරිනි. ජා. ගො. ප. සංවිධානයේ පර්යේෂණ කමිටුව විද්‍යඥයින්හට ඔවුන්ගේ පර්යේෂණ ව්‍යාපෘති සිදුකිරීම සඳහා අවශ්‍ය මහපෙන්වීම ලබාදෙන ලද අතර ජා. ගො. ප. සංවිධානය විසින් අවශ්‍ය ආධාර සහ පහසුකම් සපයන ලදී. පර්යේෂණ ප්‍රගති රැස්වීම් සඳහා සාමාන්‍ය ප්‍රේක්ෂක රැස්වීම් පැවැත්වීමට අවකාශ නොලැබුන ද පර්යේෂණ ප්‍රගතිය පිළිබඳ ව නේවාසික ව අධීක්ෂණයන් අඛන්ඩ ව සිදුවිය. ජා. ගො. ප. සංවිධානයෙහි 11වන වාර්ෂික පර්යේෂණ සමුළුව 2021 දෙසැ. මාසයේ දී සියලු නිර්දේශිත සෞඛ්‍ය ආරක්ෂණ පූර්ව සූදානම් සහිත ව පැවැත්විණි. පහත වගුව තුලින් 2021 වසරට අදාල පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ තොරතුරු සපයා ඇත.

ප්‍රධාන පර්යේෂක	අංශය	පර්යේෂණ මාතෘකාව
S.A.D.A.S.සුරවීර	BMRTD	අක්වෙරළ වැලි ආශ්‍රිත රොන්මඩ සඳහා එකතුකරන ලද ගොඩතැඟිලි නිෂ්පාදන සඳහා
S.R.රත්දික		කොහු කෙඳි ආශ්‍රිත භූ ඇතුරුම්වල විශේෂීකරණයන් හා පරීක්ෂණ ක්‍රමවේදයන් සංවර්ධනය කිරීම
M.ගත්තොරුව		ඉවතලන ද්‍රව්‍ය භාවිතයෙන් පිරිවැය ඵලදායී හරිත පෙදරේරුමය නිෂ්පාදන සංවර්ධනය
D.R.රත්නසිංහ		දෘඩ කොන්ක්‍රීට්වල කල්පැවැත්ම තකසේරු කිරීම සඳහා පරාමිති ප්‍රතිවර්තනය කිරීම
R.රුහුණුගේ	ESSD	අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැසිදිය එක්රැස් කිරීම් පද්ධතිවල පළාත් පදනම් කරගත් රැස්කරගත් වැසි ජලයෙහි තත්ව දර්ශක සහ ස්වාධීන නිරීක්ෂණ සංවර්ධනය කිරීම
හර්ෂණී කුමාරපේලි		නාගරික නිවාසවල වාතාශ්‍ර තත්ත්වයන් තක්සේරු කිරීම සහ ගෘහස්ථ වායු තත්ත්වයන් වර්ධනය කිරීම සඳහා ගෘහස්ථ ශාක භාවිතය
N.D.C ලක්මාල්		ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශවල වාතයේ තත්ත්වය පුරෝකතනය සහ සූදානම සඳහා තත්‍ය කාලීන වායු තත්ත්ව නිරීක්ෂණ ජාලයක් සංවර්ධනය කිරීම
SAMS දිසානායක		නායයෑම් අවමකිරීමේ ව්‍යාපෘතිවල පාරිසරික, සමාජීය, සෞඛ්‍යය සහ ආරක්ෂිත රථවාහන කළමනාකරණය පිළිබඳ මාර්ගෝපදේශ ලේඛන සැකසීම
M.P.අමරතුංග	LRRMD	ආක්‍රමණ ආකෘතිකරණය මඟින් කලාප පදනම් වූ වර්ෂාපතන ප්‍රශස්ත සීමාවන් භාවිතයෙන් නායයෑම් ආපද කළාප සිතියම්වල පුරෝකතන බලය ශක්තිමත් කිරීම
D.රාජපක්ෂ		ශ්‍රී ලංකාවේ නායයෑම් සඳහා කළාපීය සහ ප්‍රාදේශීය වර්ෂාපතන ප්‍රශස්ත සීමාවන් නිර්ණය කිරීම
රනිල් වීරසිංහ	HSPTD	මීරියබැද්ද නායයෑමෙන් විපතට පත්වූවන් සඳහා මාකල්දෙනිය වතුයායේ ප්‍රජා මධ්‍යස්ථානය නැවත සකස්කිරීම
දයාන් මුණසිංහ		පොළොන්නරුව හි භූමි උපද්‍රවයන්ට ඔරොත්තු දෙන ආදර්ශ නිවසක් ඉදිකිරීම
චින්තක රත්නසිරි		හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හානියට පත් නිවාසවල උපද්‍රව හඳුනාගැනීමේ ව්‍යුහාත්මක තක්සේරුකරණය සහ ඔරොත්තුදෙන නිවාස ඉදිකිරීම් සඳහා නිර්දේශ ලබාදීම

ශ්‍රී ලංකාව සඳහා වහල මත වැසිදිය රැස්කිරීමේ පද්ධති සඳහා සැලසුම් අත්පොතක්

ආරක්ෂිත ජලය සඳහා ප්‍රවේශය මූලික මානව අයිතිවාසිකමක්වන අතර එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක - 6: 'පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව' ලෙස පිළිගෙන ඇත. කෙසේ වෙතත් ලොව පුරා ආරක්ෂිත ජලය සඳහා ප්‍රවේශයන් හි අසමානතා පවතී. මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන ජල දූෂණය, නිරන්තර සහ තීව්‍ර අයහපත් කාලගුණික සිදුවීම් විසින් ප්‍රජාවන් තුල ජලය පිළිබඳ ආතතිය ඇතිකරනු ලැබේ.

වැසි ජල පද්ධතිවල විශ්වාසනීයත්වය හා සම්බන්ධ බොහෝ සාධක හේතුවෙන් වහල මත පදනම් වැසිදිය රැස්කිරීම, ජලය නිසාවෙන් ආතතියට පත් ප්‍රජාවන් අතර තිරසාර විකල්පයක් ලෙස එතරම් ජනප්‍රිය වී නොමැත. එසේ වුව ද නිසි ලෙස සැලසුම්කර ක්‍රියාත්මක කරන වහල මත පදනම් වැසිදිය රැස්කිරීමේ පද්ධති දිගුකාලීන වශයෙන්, ජලය හේතුවෙන් ආතතියට පත් ප්‍රජාවන්ගේ ගෘහස්ථ ජල ආතතීන් කළමනාකරණය සඳහා තිරසාර විසඳුමක් විය හැකි ය. ජා. ගො. ප. සංවිධානය විසින් සිදුකරන ලද අධ්‍යයනයක් මඟින් දැනට පවතින වැසිදිය රැස්කිරීමේ පද්ධති (RWH) උචිත නොවන සැලසුම් හා නිවැරදි නොවන ස්ථාපනයන් හේතුවෙන් සතුටුදායක ලෙස ක්‍රියාත්මක නොවන බව හෙළිදරව් වී ඇත.

වර්ෂා ජලය රැස්කිරීමේ පද්ධති ස්ථාපනය කිරීමේ වැදගත්කම හා ඒවායේ දුර්වලතාවයන් මෙන් ම පවතින දැනුමෙහි අඩුපාඩු හඳුනාගනිමින් ජා. ගො. ප. සංවිධානය විසින් 2019 වර්ෂයේ දී පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන යටතේ 'අනුරාධපුරයේ ගෘහස්ථ ජල ඌනතා තත්ත්වයන් මගහරවාගැනීම සඳහා තිරසාර වහලය මත පදනම් වැසිදිය රැස්කිරීමේ පද්ධතිය' නමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ 'ශ්‍රී ලංකාව සඳහා වහලය මත පදනම් වැසිජල රැස්කිරීමේ පද්ධති සඳහා සැලසුම් අත්පොත' ස්වයං මාර්ගෝපදේශක තාක්ෂණික යොමුකිරීමක් මෙන් ම තිරසාර වහලය මත පදනම් වැසිදිය රැස්කිරීමේ පද්ධති සැලසුම්කිරීම, ඉදිකිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහාවන මාර්ගෝපදේශ සංග්‍රහයක් ලෙස සංවර්ධනය කර ඇත. මෙය ජල අංශයේ වෘත්තිකයන්, ප්‍රජාමූල සංවිධාන සහ පාර්ශවකරුවන් සඳහා කාලෝචිත සහ අත්‍යවශ්‍ය තාක්ෂණික මෙවලමක් වනු ඇත. මෙම අත්පොත සිංහල, ඉංග්‍රීසි සහ දමිළ යන භාෂාවන්ගෙන් ලබාගත හැක.

ඊට සමගාමී ව ලංකා වැසිජල රැස්කිරීමේ සංසදයේ සහයෝගීතාවයෙන් භාවිතයට පහසු නිදහසේ ප්‍රවේශ වියහැකි මාර්ග ගත වැසිජල රැස්කිරීමේ විභවය ගණනය කිරීම සඳහා සුදුසු පරිගණක යෙදවුමක් සංවර්ධනය කර ඇත. මෙම මාර්ග ගත ක්‍රමය යාවත්කාලීන ප්‍රමාණයන් තක්සේරු කිරීම ඇතුලු වෙනස් ස්ථරයන් තුනක් යටතේ නිර්මාණය කර ඇත. මෙහි 2000 සිට 2019 දක්වා මාසික වර්ෂාපතන අගයන් අදාල ක්ෂේත්‍ර සත්‍යාපන සහිත සාමාන්‍ය ගෘහස්ථ ජල අවශ්‍යතාවයන් සම්පූර්ණ පරිශීලක මාර්ගෝපදේශයන් සහ ජල අවශ්‍යතා මත පදනම් මාසික ජල බෙදහැරීම් සමාකරණ ආකෘතියක් රැස්කර ගතහැකි පරිමාව සහ ගබඩා ධාරිතාවයන් අන්තර්ගත කර ඇත.





ඉවතලන ද්‍රව්‍ය යොදාගනිමින් පිරිවැය එලදායී හරිත පෙදෙරේරු නිෂ්පාදන සංවර්ධනය කිරීම

ඇඟලුම් කර්මාන්තයේ ඉවතලන කෘතිම තන්තු මිශ්‍ර රෙදිපිළි (පොලියස්ටර් ස්පෑන්ඩෙක්ස්) අපද්‍රව්‍ය ලෙස සැලකේ. දැනට මේවා සිමෙන්ති නිෂ්පාදන ක්‍රියාවලියේ දී ඉන්ධන ලෙස පිළිස්සීම සඳහා භාවිතා කෙරෙන අතර ශේෂය නීති විරෝධී කසල ලෙස බැහැරකිරීම සිදුකෙරේ. පාරිසරික සුරක්ෂිතතාවය කෙරෙහි ද අවධානය යොමුකරමින් ඉදිකිරීම් කර්මාන්තයේ අමුද්‍රව්‍යයක් ලෙස රෙදිපිළි අපද්‍රව්‍ය භාවිතය කෙරෙහි අධ්‍යයනය සිදුකරන ලදී. ඒ අනුව මෙම පර්යේෂණ තුලින් වැඩි දියුණු කල කම්පන අවශෝෂණය සහ ජල පාරගම්‍ය ලක්ෂණ සහිත අඩිපාරවල් සහ එළිමහන් ක්‍රීඩා භූමි මතුපිට සඳහා යෝග්‍ය රෙදි කාවද්දන ලද බිම් ඇතුරුම් ගල් සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමුවිය. සංවර්ධනය කරන ලද බිම් ඇතුරුම් ගල්, කොන්ක්‍රීට් බිම් ඇතිරුම් ගල් සඳහාවන BS EN 1338: 2003 අවශ්‍යතාව සහ පරීක්ෂණ ක්‍රමවේදයට අනුකූල විය. අතිරේක අංගයක් ලෙස සංවර්ධනය කරන ලද බිම් ඇතිරුම් ගල්වලට බලපෑම් බලය 20% කින් අවමකිරීමේ හැකියාව පවතින අතර එළිමහන් ක්‍රීඩා මතුපිටක පාදයන්ට වඩාත් සුව පහසුව සඳහාවන අවශ්‍යතා සපුරාලනු ලබයි. ඒ අනුව එළිමහන් ක්‍රීඩා පෘෂ්ඨයන් සඳහා සංවර්ධනය කරන ලද රෙදි කාවද්දන ලද බිම් ඇතිරුම් ගල් නිර්දේශ කල හැකි ය. තව ද, මෙම බිම් ඇතිරුම් ගල්වල ජල පාරගම්‍යතා හැකියාව, කොන්ක්‍රීට් බිම් ඇතිරුම් ගල්වල එම හැකියාවට වඩා සියගුණයකින් පමණ වැඩිවන බැවින් අධික වර්ෂාවක දී මතුපිට ජලය ගලායාම සැළකිය යුතු ලෙස අවමකරගැනීමේ හැකියාව සැලසේ.

බිතුමික්ස් (Bitumix) පුද්ගලික සමාගම, මාස් හෝල්ඩිංස් (MAS Holdings) පුද්. සමාගම සහ ජා. ගො. ප. සංවිධානය ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස සංවර්ධනය කරන ලද බිම් ඇතුරුම් ගල් පනාගොඩ යුදහමුදු රෙජිමේන්තු මූලස්ථානයේ ඇවිදින මංතීරුවක ඇතුරුම්කරන ලදී. එහි පරිශීලකයන්ගෙන් ලැබෙන ප්‍රතිචාර අනුව මෙම බිම් ඇතුරුම් ගල්වලින් සම්ප්‍රදායක බිම් ඇතුරුම් ගල්වලට වඩා සුවපහසුවක් පාදයට සැලසෙන බව සඳහන් වේ.





සිම්පෝසියම

ජා. ගො. ප. සංවිධානයේ 11වැනි වාර්ෂික පර්යේෂණ සමුළුව 2021

INNOVATION GEARED
BUILDING RESILIENCE

නව නිපැයුම් ඉලක්ක කරගත් ගොඩනැගිලි ඔරොත්තුදීමේ හැකියාව

ජා. ගො. ප. සංවිධානය විසින් සංවිධානය කරන ලද 11වැනි වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය 'නවෝත්පාදන තුලින් ප්‍රත්‍යස්ථිතිය ගොඩනැංවීම' යන තේමාව යටතේ 2021 දෙසැ. 14 දින කොළඹ වෝටර්ස් එජ් හෝටල් පරිශ්‍රයේ දී උත්සවාකාරයෙන් ආරම්භ කරන ලදී. මෙම මතරම් අවස්ථාව පර්යේෂකයන්, ආපදා කළමනාකරණ වෘත්තිකයන්, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ දේශීය හා ජාත්‍යන්තර ආයතනවල කීර්තිමත් විද්‍වතුන් ඇතුළු සීමිත පිරිසකගේ සෘජු සහභාගීත්වයෙන් සහ තවත් බොහෝ සහභාගිකයින් මාර්ග ගත ක්‍රමවේදය ඔස්සේ යන දෙමුහුන් ආකාරයේ අවස්ථාවක් වශයෙන් පැවැත්විණි. මෙම සම්මන්ත්‍රණය තුලින් සාකච්ඡා කිරීමට, අදහස් හා අත්දැකීම් හුවමාරු කරගැනීමට කදිම වේදිකාවක් සැලසිණි.

සිද්ධික් මහතා විසින් රැස්ව සිටි පිරිස ඇමතීම සිදුවිය. පසුව පහත සඳහන් දෑ එළිදක්වන ලදී.

"ආපදාවට ඔරොත්තු දෙන ඉදිකිරීම් සඳහාවන තාක්ෂණික මාර්ගෝපදේශය" යන ජා. ගො. ප. සංවිධානයෙහි සම්මන්ත්‍රණ ක්‍රියාදම ග්‍රන්ථය එළිදැක්වීම

වහලය මත වැසිජලය රැස්කිරීම සඳහාවන අත්පොත සහ අන්තර්ජාල පාදක ගණකයන්

ජීවත්වන විද්‍යාගාර (Living lab) සංකල්පය කළුතර දිස්ත්‍රික්කය සඳහා නියාමක මොබිලයිස් (Mobilize) වේදිකාව භාවිතය

රතු සහ කහ කළාප සංකල්පය භාවිතාකරමින් කෑගල්ල දිස්ත්‍රික්කයේ නායයෑම් බලපාන කළාප ප්‍රතිසීමාතීර්ණය කිරීමේ නියමු ව්‍යාපෘතිය

තත්‍යකාලීන නායයෑම් පූර්ව අනතුරු ඇඟවීම් බෙදහැරීමේ ජංගම යෙදවුම



මෙම උත්සව අවස්ථාවේ ප්‍රධාන ආරාධිතයා ලෙස ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් (විශ්‍රාමික) ජනරාල්, කමල් ගුණරත්න මහතා සහභාගී විය. සමාරම්භක සැසියතුල දී ජා. ගො. ප. සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්. ඉංජිනේරු (ආචාර්ය) ආසිරි කරුණාවර්ධන මහතා විසින් පිළිගැනීමේ කතාව සිදුකරන ලදී. අනතුරු ව, ලෝක ආහාර වැඩසටහනෙහි (WFP) අධ්‍යක්ෂ, අබ්දුල් රහීම්



ප්‍රධාන දේශක, නවසීලන්තයේ ගොඩනැගිලි කේත පිළිබඳ විශේෂඥ ඉංජි. මයික් ස්ටැෆර්ඩ් විසින් ප්‍රත්‍යස්ථිතික නිර්මාණ පරිසරය සඳහා ගොඩනැගිලි කේත' යන තේමාව යටතේ ප්‍රධාන ආරම්භක දේශනය ඉතා ආකර්ෂණීය අයුරින් පවත්වන ලදී. ඉන් අනතුරු ව මොරටුව විශ්වවිද්‍යාලයේ ජ්‍යෙ. මහාචාර්ය චින්තා ජයසිංහ මහත්මිය විසින් 'ප්‍රත්‍යස්ථිතිය ගොඩනැංවීම' යන මැයෙන්, විද්වත් කතිකාව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භූ විද්‍යා පිළිබඳ මහාචාර්ය, නිලක්

හේවාවසම්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙ. කතිකාචාර්ය අචාර්ය කුෂාන් විජේසුන්දර, මධ්‍යම පරිසර අධිකාරියේ හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් කාන්ති ද සිල්වා සහ ජයිකා ආයතනයේ SABO ව්‍යාපෘතියෙහි කණ්ඩායම් නායක, තෝරු කොයිකේ යන මහත්ම මහත්මීන්ගේ කමිටු සාකච්ඡාවක් සමඟ සමුළුවේ වැඩ කටයුතු ඉදිරියට පවත්වාගෙන යන ලදී.



සමුළුවේ ප්‍රථම දිනය 'ප්‍රත්‍යස්ථිතික පරිසරය සඳහා ආයෝජනය' යන තේමාව යටතේවන තාක්ෂණික සැසියක් සහිත ව ව්‍යුහගත ව පැවති අතර එහි මූලසුන මොරටුව විශ්වවිද්‍යාලයේ මහාචාර්ය, උදේනි තවගමුව මහතා විසින් හොබවන ලදී. මෙම වැඩ සටහන අවසානය දක්වා සාර්ථක කරගැනීමට භෞතික වශයෙන් මෙන් ම මාර්ග ගත ක්‍රමවේදය ඔස්සේ සහභාගීත්වය සැපයූ සම්පත් දායකයින්හට ජා. ගො. ප. සංවිධානය තම කෘතවේදීත්වය පුදකර සිටී.

සම්මන්ත්‍රණයේ දෙවන දිනය '2021 දෙසැ. මස 15 වන දින කොළඹ 7, විද්‍ය මාවතේ ජාතික ආරක්ෂක සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ දී (ආපදා කළමනාකරණ අංශයේ) පැවැත්විණි. දෙවන දිනයේ කටයුතුවලට ප්‍රධාන දේශනයක්, කණ්ඩායම් සාකච්ඡාවක් සහ තාක්ෂණික සැසිවාරයන් දෙකක් අන්තර්ගත විය.

දෙවන දිනයේ ජාතික ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම්, මේජර් ජනරාල්, සුදන්ත රණසිංහ මහතා විසින් රැස්ව සිටි පිරිස අමතන ලද අතර පසුව ප්‍රධාන දේශනය ට්සුකුබා විශ්වවිද්‍යාලයේ ජෙව සහ පාරිසරික විද්‍යාපීඨයේ සහාය ආචාර්ය, මහාචාර්ය උච්ඩා තාරෝ විසින් සිදුකරන ලදී. ඉන් අනතුරු ව තිරසාර සංවර්ධන ඉලක්ක ළඟාකරගැනීම සඳහා 'සෙන්ඩායි රාමුව' පිළිබඳ විද්වත් සාකච්ඡාවක් ෆර්සන් හසීම් මහතා පරිපාලක වශයෙන් සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, රොහාන් සමරක්කොඩි මහතා, එයිටිකන් ස්පෙන්ස් පීඑල්සී (Aitken Spence PLC) ආයතනයේ සමූහ ව්‍යාපාර තිරසාරභාවය හා සංවර්ධනය පිළිබඳ සාමාන්‍යාධිකාරී, යසාංගි මුදිතා රත්දෙනි, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි ප්‍රතිපත්ති විශේෂඥ හා කණ්ඩායම් නායක (දේශගුණය හා පරිසර) ආචාර්ය, බුද්ධික හපුආරච්චි සහ නිදහස් උපදේශක, ආචාර්ය, විශාකා හිදැල්ලගේ යන අයගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී. ගොඩනැගිලි පර්යේෂණවල තාක්ෂණික දියුණුව සැසිය මොරටුව විශ්වවිද්‍යාලයේ ජ්‍යෙ. කතිකාචාර්ය, එච්. එම්. වයි. සී. මල්ලිකාරච්චි මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති අතර එහිදී කතුවරුන් සිව් දෙනෙකු විසින් ඔවුන්ගේ පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරන ලදී.

අපරභාගයේ දී 'ෆුරුනෝ ඉලෙක්ට්‍රික්' ආයතනයේ තකයොෂි හිරෝස් මහතා විසින් විශේෂ සැසියක් ලෙස නායයෑම් පූර්ව අනතුරු ඇඟවීමේ X-band කාලගුණ රේඩාර් යෙදවුම පිළිබඳ ව ප්‍රථමයෙන් ඉදිරිපත් කළ අතර අනතුරු ව JICA ආයතනයේ SABO ව්‍යාපෘතියෙහි කණ්ඩායම් නායක තෝරු කොයිකේ, මහතාගේ ප්‍රධානත්වයෙන් නායයෑම් අවමකිරීම සඳහා ව්‍යුහාත්මක නොවන ක්‍රියාමාර්ග පිළිබඳ ව තාක්ෂණික සැසිය පවත්වන ලදී. එහිදී බොහෝ කතුවරුන් සංඛ්‍යාවක් තමන්ගේ පත්‍රිකා ඉදිරිපත් කරන ලදී. අවදානම් කළමනාකරණය සඳහා ඩිජිටල් තාක්ෂණය යොදගැනීම පිළිබඳ අවසන් තාක්ෂණික සැසිය එක්සත් රාජධානියේ සල්ෆර්ඩ් විශ්වවිද්‍යාලයෙහි THINKlab අංශයේ අධ්‍යක්ෂ, මහාචාර්ය ටෙරන්ස් ප්‍රතාන්දු මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති අතර එහිදී තවත් කතුවරුන් සිව්දෙනෙකු විසින් සිය පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරන ලදී.

මෙම සමුළුව දේශීය හා ජාත්‍යන්තර ආයතනවල පර්යේෂකයන්, ආපදා කළමනාකරණ වෘත්තිකයන්, ප්‍රතිපත්ති සම්පාදකයන් සහ කීර්තිමත් ප්‍රවීනයන් ආකර්ෂණය කරගැනීමට සමත්වූ අතර සාකච්ඡාකිරීම, අදහස් හුවමාරු කරගැනීම සහ අත්දැකීම් බෙදගැනීම සඳහා සුවිශේෂී වේදිකාවක් විය. සමුළුවේ මුද්‍රිත පිටපතක් සහභාගීවූවන් වෙත ලබාදීම සිදුකරන ලදී.







"ප්‍රත්‍යස්ථීතිය ගොඩනැගීම පිළිබඳ කමිටු සාකච්ඡාව" තාක්ෂණික සැසි

නායයෑම් පූර්ව අනතුරු සඳහාවන "NBRO EW" ජංගම දුරකතන යෙදවුම



2021 දෙසැ. මස 14වන දින බත්තරමුල්ල 'වෝටර්ස් එජ්' හි දී පැවති 2021 ජා. ගොා. ප. සංවිධානයේ 11වැනි වාර්ෂික පර්යේෂණ සමුළුවේ දී "NBRO EW" ජංගම දුරකතන යෙදවුම එළිදක්වන ලදී. නවීනතම යෙදවුව තුල එහි පරිශීලකයන්හට තිල නායයෑම් පූර්ව අනතුරු ඇඟවීම් ක්ෂණික ව ලබාගැනීමට අවකාශ සැලසීම හා පරිශීලනය, අනතුරු ඇඟවීම බලපාන කළාපය තුල සිටී නම් ඔහුට ග්‍රහණය කරගැනීමට පහසු සජීවී ස්ථාන සිතියමක් මත ඵලදායී අනතුරු ඇඟවීමේ දෘශ්‍යමාන කිරීම් වැනි වැදගත් විශේෂාංග රාශියක් ඇතුලත් වේ.

මෙම යෙදවුම මඟින් සාමාන්‍ය ජනතාවට විශේෂයෙන් ම නායයෑම් අවදානම් ප්‍රදේශවල ජීවත්වන ජනතාවට නායයෑම් පූර්ව අනතුරු ඇඟවීම් සුමට ව හා ඉක්මණින් බෙදහැරීමට හැකියාව සැලසේ. යෙදවුමේ ඇතුලත් ප්‍රධාන විශේෂාංග:

- නායයෑම් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් ක්ෂණික ව පරිශීලකයින්ට ලබාදීම
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් නිකුත් කරන ලද සියලුම අනතුරු ඇඟවීම් පිළිබඳ විස්තරාත්මක දර්ශකයක් සැපයීම
- නායයෑම් පූර්ව අනතුරු ඇඟවීම් බලපාන ප්‍රාදේශීය පරිශීලකයින්ගේ සජීවී ස්ථානය සමඟ භූගෝලීය සහ චන්ද්‍රිකා සිතියම් තුල ප්‍රදර්ශනය වීම
- මාර්ගගතව හා බාහිර වශයෙන් ලබාගත හැකිවීම
- ආපදා කළමනාකරණ ඇමතුම් මධ්‍යස්ථානය වෙත ක්ෂණික ව සෘජු ඇමතුම් පහසුකම

ජා. ගොා. ප. සංවිධානයේ ජ්‍යෙෂ්ඨ විද්‍යඥ, එම්. එස්. එම්. අරුස් මහතා විසින් යෙදවුම සංවර්ධනය කර ඇත. යෙදවුම Google Play Store වෙතින් හෝ Apple Appstore වෙතින් භාගත කරගැනීමේ හැකියාව ඇත.

"NBRO EW" යෙදවුම මෙතැනින් ලබාගන්න. Appstore / Google Play

ජංගම වායු තත්ත්ව අධීක්ෂණ ඒකකය



ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශවල වායු තත්ත්ව අධීක්ෂණ කටයුතු සඳහා අධිතාක්ෂණික ස්වයංක්‍රිය ජංගම වායු තත්ත්ව අධීක්ෂණ ඒකකය, වාහන විමෝචන පරීක්ෂණ (VET) කාර්යාල මඟින් ජා. ගොා. ප. සංවිධානය වෙත භාරදෙන ලදී. මෙම පරීක්ෂණ ඒකකය සතුව සල්ෆර් ඩයොක්සයිඩ් (SO_2), නයිට්‍රජන් ඔක්සයිඩ (NO_2 හා NO), කාබන් මොනොක්සයිඩ (CO), ඕසෝන් (O_3) මෙන් ම හයිඩ්‍රොකාබන (HC) සහ (PM_{10} හා $PM_{2.5}$ වැනි) සියලු ආකාරයේ වායු දූෂක අංශු ම ය ද්‍රව්‍යයන් හි තත්‍ය කාලීන මට්ටම් අධීක්ෂණය සඳහා පහසුකම් සහිත වේ. මීට අමතර ව සුළඟේ දිශාව, සුළඟේ වේගය, උෂ්ණත්වය, සාපේක්ෂ ආර්ද්‍රතාවය, වාර්ෂාපතනය සහ සූර්ය විකිරණය ආදී කාලගුණික පරාමිතීන් මැනීමේ පහසුකම්වලින් ද සමන්විත වේ. ඉතා ඉහල නිරවද්‍ය ප්‍රමිති තාක්ෂණයන් සහ වරින් වර සම්මත ක්‍රමාංකන වායූන් සමඟ ක්‍රමාංකනය සිදුකරන බැවින් ජා. ගොා. ප. සංවිධානය සාමාන්‍යයෙන් වායු තත්ත්ව අධීක්ෂණයේ දී වෙනත් තාක්ෂණික ක්‍රමවේදයන් මඟින් රැස්කරගත්තා දත්ත වලංගු කිරීමේ දී මෙම පද්ධතිය ඉතා වැදගත් වේ. මෙම පද්ධතියේ සාමාන්‍ය වටිනාකම රු. මිලියන 40.0 ක් පමණ වේ.

පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු

USGS සහයෝගය මඟින් OFDA/USAID සංවිධානයේ සහ සම්බන්ධීකරණය යටතේ USGS සහ වනාන්තර හිම සහ භූදර්ශන (WSL) පර්යේෂණ සඳහාවන ස්විස් ෆෙඩරල් ආයතනයේ සම්පත් දායකයින්ගේ සහභාගීත්වයෙන් මාර්ග ගත වැඩමුළු දෙකක් 'නායයෑම් ගලායෑමේ මාර්ග සමාකරණය' යනුවෙන් පවත්වන ලදී. එක් එක් වැඩමුළුව තුල දී වෙනස් සමාකරණ ආකෘතීන් ඉලක්කගත විය.

RAMMS (වේගවත් ස්කන්ධ චලනයන් සමාකරණය) මාර්ග ගත වැඩමුළුව-2021 මාර්තු 19

RAMMS යනු දැනට බොහෝ රටවල නායයෑම් සමාකරණය සඳහා භාවිතාවන ප්‍රබල සංඛ්‍යාත්මක සමාකරණ මෙවලමකි. WSL හි වනාන්තර හිම සහ භූදර්ශන පර්යේෂණ සඳහාවන ස්විස් ෆෙඩරල් ආයතනය (WSL) සහ හිම සහ කුණාටු පර්යේෂණය සඳහාවන ආයතනය (SLF) යන ආයතනයන් හි විශේෂඥයන් කණ්ඩායමක් විසින් RAMMS සමාකරණය සංවර්ධනය කර ඇත.

මෙම ආයතනයන් හි විශේෂඥයින් නම් වශයෙන් ආචාර්ය, පෙරී බාටර්ල්ට් (ඩෙවොස් හි RAMMS සමාකරණය සඳහාවන පර්යේෂණ කණ්ඩායම් නායක), මාක් ක්‍රිස්ටන් (ඩෙවොස් හි WSL ආයතනයේ RAMMS සමාකරණය සඳහාවන තාක්ෂණික වැඩසටහන් නායක) සහ බ්‍රයන් මැකාඩෙල් (RAMMS පර්යේෂණ කණ්ඩායම් හිටපු සාමාජික) යන අය විසින් වැඩමුළුව සඳහා නායකත්වය සපයන ලදී. වැඩමුළුව RAMMS පිළිබඳ කෙටි දළ විශ්ලේෂණයක්, පරිශීලක අතුරු මුහුණත හඳුන්වාදීම, ශ්‍රී ලංකාව සහ නවසීලන්තය යන දෙරටෙහි ම නායයෑම් මාර්ගෝපදේශන සහිත උදාහරණයන් RAMMS හි නව වර්ධනයන් පිළිබඳ කෙටි දළ විශ්ලේෂණයකින් අනතුරු ව ශ්‍රී ලංකාව තුල නායයෑම් සඳහා භාවිතාකිරීම පිළිබඳ සාකච්ඡා කිරීම ද සිදුවිය.

'ලහාර්' මාර්ග ගත වැඩමුළුව 2021 මැයි 6 දින

'ලහාර්' (Laharz) යනු භූ විෂමතාවයන් හැර වෙනත් අඩව් විශේෂිත තොරතුරු නොමැතිවිට සුන්බුන් ගලායාම සහ ලහාර් උපද්‍රව සිතියම් ඉතා ඉක්මණින් ජනනය කිරීමේ හැකියාව ඇති සංඛ්‍යාත ම ය වශයෙන් පදනම් වූ පරිගණක වැඩසටහනකි. මෙය GIS වේදිකාව මත ගොඩනගා ඇති පයිතන් පරිගණක භාෂා ම ය වැඩසටහනක්වන අතර එක්සත් ජනපද භූ විද්‍යා සමීක්ෂණ ආයතනයේ (USGS) නිපැයුමකි. මෙම වැඩමුළුව එක්සත් ජනපද භූ විද්‍යා තාක්ෂණ ආයතනයේ භූ විද්‍යඥයින්වන ආචාර්ය, කොරිනා සෙරොවෙස්කි හා ස්ටීවන් ස්ලාෆටර් විසින් මෙහෙයවන ලද අතර 'ලහාර්' පිළිබඳ කෙටි දළ විශ්ලේෂණයකින් මෙන් ම එක්සත් ජනපදයේ මෙන් ම ශ්‍රී ලංකාවේ යන දෙරටෙහි ම උදාහරණ භාවිතා කරමින් කණ්ඩායම් අභ්‍යාස සහ නිරූපනය කිරීම් මෙන් ම 'ලහාර්' හි අනාගතය පිළිබඳ හැඳින්වීමකින් ද යුක්ත විය.

මෙම වැඩමුළුව ජා. ගෙ. ප. සංවිධානයේ විද්‍යඥයින්හට විශේෂඥයින් වෙතින් ඉගෙනීම සඳහා මහඟු අවස්ථාවක් විය. ජා. ගෙ. ප. සංවිධානයෙහි නායයෑම් සංවේදිතා සිතියම්, උපද්‍රව සහ අවදානම් සිතියම් බවට සංවර්ධනය කිරීම සඳහා වැඩමුළුව මඟින් ජා. ගෙ. ප. සංවිධානය වෙත ආකෘති නිර්මාණයේ දී අත්හදා බැලීම සඳහා අගනා විකල්ප මෙවලම් සම්පාදනයක් සිදුවිය. මෙම වැඩමුළුව සාර්ථක කරගැනීම සඳහා OFDA/USAID, USGS සහ WSL යන සංවිධාන වෙත ඔවුන් දක්වන ලද සහයෝගය සහ ප්‍රයත්නයන් වෙනුවෙන් ජා. ගෙ. ප. සංවිධානයෙහි මහත් කෘතවේදීත්වය පළකරන අතර විශේෂයෙන් ම මෙම වැඩමුළු ව සංවිධානයේ දී හා සම්බන්ධීකරණයේ දී ජා. ගෙ. ප. සංවිධානය හා USGS අතර සම්බන්ධතාවය සපයන ලද ස්ටීවන් ස්ලාෆටර් මහතා වෙත ලබාදුන් සියලු ආකාරයේ සහයෝගයන් වෙනුවෙන් ජා. ගෙ. ප. සංවිධානයෙහි සුවිශේෂී ස්තූතිය හිමිවිය යුතු ය.



රූපය 1: RAMMS භාවිතයෙන් සිදුකරන ලද සමාකරණය



රූපය 2: ලහාර් භාවිතයෙන් සිදුකරන ලද සමාකරණය

ප්‍රධාන උපදේශන ව්‍යාපෘති

ඉදිකිරීම් ව්‍යාපෘතිවල භූ තාක්ෂණික ගැටලු නිරවුල් කිරීම

ඉතා උස් ගොඩනැගිලි සහ මහා පරිමාණයේ ගොඩනැගිලි ඇතුලත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී පුළුල් කැනීම් හා අත්තිවාරමේ කටයුතු සිදුකිරීමේ දී අසල්වැසි ගොඩනැගිලිවලට සෘණාත්මක ව බලපෑම් සිදුවීමට ඉඩ ඇති බැවින් ඒවා සඳහා අනුමැතිය ලබාදීමට පෙර අදාළ විමර්ශනයන් සිදුකරන ලෙස හා වාර්තා ලබාදෙන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය, කොළඹ මහනගර සභාව සහ සංචාරක මණ්ඩලය වැනි අධිකාරීන් වෙතින් ජා. ගො. ප. සංවිධානය වෙත ඉල්ලීම් සිදුකෙරේ. පසුගිය වසර 5 තුල නිකුත් කල වාර්තා පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

වසර	2017	2018	2019	2020	2021
වාර්තා සහ අලුත්කිරීම් සංඛ්‍යාව	32	38	20	09	44

ගොඩනැගිලි පිළිබඳ තත්ත්ව වාර්තා නිකුත්කිරීම

ජා. ගො. ප. සංවිධානය විසින් ගොඩනැගිලිවල තත්ත්වය හා ඒවායේ ව්‍යුහාත්මක අඛණ්ඩතාවය තක්සේරු කිරීම සඳහා විමර්ශනයන් සිදුකරනු ලබන අතර අදාළ වාර්තා නිකුත්කිරීම ගාස්තු මත පදනම් සේවාවක් වශයෙන් ඉටුකරනු ලබයි. මෙය හුදෙක් පාරිභෝගික ඉල්ලම් මත හෝ උසාවි නියෝගයක් මත සිදුකරනු ලබයි. බොහෝවිට මෙබඳු සේවාවන් යාබද දේපල තුල සිදුකරනු ලබන ඉදිකිරීම් හේතුවෙන් ගොඩනැගිලිවලට සිදුවන හානිය තක්සේරු කිරීම සඳහා අවශ්‍ය වේ. මෙම ක්‍රියාවලිය සැලකිය යුතු දීර්ඝ කාලයක් පුරා ජා. ගො. ප. සංවිධානය විසින් සිදුකරනු ලබන අතර පහත වගුව තුලින් තොරතුරු ලබා දී ඇත.

වසර	2015	2016	2017	2018	2019	2020	2021
වාර්තා සංඛ්‍යාව	42	60	148	116	124	116	141

මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා භූ තාක්ෂණික විමර්ශන සහ සැලසුම්

මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියෙහි 3වන අදියර (CEP-III) සඳහා පොතුහැර සිට ගලගෙදර දක්වා සවිස්තරාත්මක භූ තාක්ෂණික විමර්ශනය සහ ඉංජිනේරු සැලසුම් කිරීම 2021 ඔක්තෝම්බර් මස සිට දෙසැම්බර් දක්වා කාලය තුල ජා. ගො. ප. සංවිධානයේ භූ තාක්ෂණික ඉංජිනේරු අංශය (GED) විසින් සිදුකරන ලදී.

භූ තාක්ෂණ ඉංජිනේරු අංශය විසින් රඹුක්කන සිට පොතුහැර දක්වා කි. මී. 9.5 ක් පමණ ආවරණය වන පරිදි II අදියර සඳහා මෘදු බිම් සංවර්ධනය කිරීමේ සහ අත්තිවාරම් නිර්මාණය කිරීමේ ක්‍රමවේදයන් සපයන ලද අතර ජාතික වශයෙන් වැදගත්වන මෙම විශාල ව්‍යාපෘතිය සුමට ව ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය වෙත සහයෝගය ලබා දී ඇත. මාර්ගය දිගේ සිදුරු 293 ක් ආවරණයවන පරිදි භූ තාක්ෂණික විමර්ශනයන් සිදුකරන ලද මෙම ව්‍යාපෘතිය මෑත ඉතිහාසයේ ජා. ගො. ප. සංවිධානය විසින් සිදු කරන ලද විශාල ත ම ව්‍යාපෘතිවලින් එකකි.

භූ විද්‍ය ඉංජිනේරුවන් විසින් සිදුරු තොරතුරු භාවිතාකරමින් උප පෘෂ්ඨීය පැතිකඩ ආදර්ශනය සිදුකරන ලද අතර නිර්මාණ ඉංජිනේරුවන් විසින් මෘදුබිම් වැඩි දියුණු කිරීම්, කැපුම් බෑවුම්, බැම් සහ ඉහලින් ගමන්කිරීම් සඳහා අත්තිවාරම් ව්‍යුහයන්, යටිමං සහ බෝක්කු සැලසුම් සිදුකරන ලදී. සැලසුම් හා අධ්‍යයන අරමුණු සඳහා පස්, පාෂාණ සහ ජලය පරීක්ෂා කිරීම ජා. ගො. ප. සංවිධානයෙහි ප්‍රතීතනය ලත් පස් පරීක්ෂණාගාරය, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ පාරිසරික විද්‍යාගාර මගින් සිදුකරන ලදී. මෙම උපදේශන කටයුතු සඳහා ඇස්තමේන්තු ගත මුදල රු. මිලියන 95.0 කි.





අනෙකුත් තාක්ෂණික මැදිහත්වීම්

'දීඝවාපී ස්තූපයේ' ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ගඩොල්වල ගුණාත්මක සංවර්ධනය

'දීඝවාපී ස්තූපය' ප්‍රථමයෙන් කි. ව. 3වන සියවසේ දී ඉදිකර ඇත. එතැන් සිට අවස්ථා කිහිපයක දී නැවත ගොඩනැගීම් සිදුකර ඇත. ස්තූපයෙහි වර්තමාන තත්ත්වය හේතුවෙන් ස්තූපය සඳහා අවශ්‍යවන මැටි ගඩොල් නිෂ්පාදන ක්‍රියාවලියෙහි අධීක්ෂණ කටයුතු සඳහා ජා. ගො. ප. සංවිධානය සම්බන්ධ කරගැනීමට යෝජනා වී ඇත. මීට පෙර මෙම කටයුතු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සිදුවී ඇත. මෙම ක්‍රියාවලිය අධීක්ෂණය සඳහා රසායනාගාර කළමනාකරු සහ ප්‍රාදේශීය විද්‍යඥයින් මෙම ක්‍රියාවලිය නිරන්තරයෙන් අධීක්ෂණය සඳහා ස්ථානීය පරීක්ෂාවන් සිදුකරන ලද අතර මැටි ගඩොල්වල සම්පීඩන ශක්තිය පරීක්ෂාවට භාජනය කරන ලදී. ජා. ගො. ප. සංවිධානයේ ගොඩනැගිලි ද්‍රව්‍ය පර්යේෂණ සහ පරීක්ෂණ අංශයෙන් වැඩිදියුණු කිරීමේ පියවරයන් ලෙස ක්‍රියාවලිය තුල වෙනස්කම් හඳුන්වාදීමට ක්‍රියාකර ඇත.








කොළඹ මහනුවර මාර්ගයේ කඩුගන්නාව ප්‍රදේශයේ බෑවුම් අස්ථාවරත්වය

කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි 25/ඒ, ගතේතැන්න ග්‍රාම නිලධාරී වසමේ පහල කඩුගන්නාව ප්‍රදේශයේ කොළඹ මහනුවර මාර්ගයේ 98 වැනි කි. මීටර් කනුව ආසන්නව මාර්ගයට ඉහලින් වූ බෑවුම්වල භූමි අස්ථාවර ස්වභාවයක් සටහන් විය. 2021.11.10 වන දින වනවිට ආනති, ඉරිතැලීම් නිරීක්ෂණය වූ අතර ජා. ගො. ප. සංවිධානයේ නිලධාරීන් විසින් අඩවියෙහි මූලික ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදුකරන ලදී. අනතුරු ව ස්ථානයේ පැවති අනතුරුදායක තත්ත්වය සැළකිල්ලට ගනිමින් කෑගල්ල දිස්ත්‍රික් ලේකම්වරයාගේ උපදෙස් පරිදි ජා. ගො. ප. සංවිධානය සහ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ප්‍රධාන මාර්ගය තාවකාලික ව වසා දැමීමට කටයුතු කරන ලදී.

ඉන් පසුව, කෙටි කාලීන ක්‍රියාමාර්ගයන් ලෙස පහත සඳහන් පියවරයන් ගනු ලැබිණි.

1. අස්ථායී කලාපයේ ඉහල බෑවුම් හා ආශ්‍රිත ඉරි තැලීම් ආවරණය කිරීම
2. විහව අස්ථායී බෑවුමෙහි ඉහළ කළාපයේ මතුපිට ජලාපවහන රටාව නියාමනය කිරීම සහ අස්ථායී කලාපයෙන් වැසි ජලය ඉවතට හරවා යැවීම සඳහා මතුපිට ජලාපවහන පද්ධතියක් හඳුන්වා දීම.
3. අස්ථායී කළාපයේ අභ්‍යන්තර ව එකතු වූ භූගත ජලය ඉක්මනින් ඉවත්කිරීම සඳහා භූමියෙහි පිහිටීම අනුව තිරස් කානු 6-8 ක් ඉදිකිරීම.
4. අස්ථායී කළාපයේ ප්‍රධාන අක්ෂය ඔස්සේ සහ කොළඹ මහනුවර ප්‍රධාන මාර්ගයට සමාන්තර ව අස්ථායී බෑවුම් කලාපය ඔස්සේ, අස්ථායී කලාපයේ අධික බර සහ ලිස්සා යාමේ මතුපිට ගැඹුර අධ්‍යයනය කිරීම සඳහා භෞතික සමීක්ෂණයක් සිදුකිරීම



ඉහත අස්ථායී භූමිය මත සිදුකරන ලද භූ භෞතික විද්‍යුත්මක පරීක්ෂණයට අනුව සහ පවතින දත්තයන්ට අනුව, මෙම ස්ථානය වටා මීටර් 5-6 පමණ ඝණකම් පස් ස්ථාරයක් පවතින අතර අභ්‍යන්තරයේ පාෂාණ පිහිටීම අනුව (ඇඳ පාෂාණයේ රැලි සහිත මතුපිට/රැලි සහිත ස්වභාවය) සහ මෙම කලාපය පහලට ගමන්කිරීමට ස්වාභාවික ප්‍රතිරෝධයක් ඇති බව ද නිරීක්ෂණය විය.

මෙම අස්ථායී කලාපය තුල නිර්මාණය වූ ආතති ඉරිතැලීම් ක්‍රමයෙන් වැඩිවීම දින තුනක කාලයක් තුල ස්ථාන 11 දී නිරීක්ෂණය විය. දත්තවලට අනුව මෙම ප්‍රදේශවල සුළු විස්ථාපනයක් නිරීක්ෂණය වූ නමුත් සැලකිය යුතු තිරස් හෝ සිරස් විස්ථාපනය වීමක් මෙතෙක් නිරීක්ෂණය වී නොමැත.

තත්ත්වය තාවකාලික ව පාලනය කිරීමට ජා. ගො. ප. සංවිධානය සහ මාර්ග සංවර්ධන අධිකාරිය සමත්වී ඇත. ඉහත කරුණු සැළකිල්ලට ගනිමින් ජා. ගො. ප. සංවිධානය විසින් සාමාන්‍ය කාලගුණික තත්ත්වයන් යටතේ සංවිධානය විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශයන්ට අනුව 2021 නොවැම්බර් 17 දිනෙන් පසු ඉහත ප්‍රදේශයේ ගමනාගමනය සඳහා කොළඹ මහනුවර ප්‍රධාන මාර්ගය නැවත විවෘත කිරීමට යෝජනා කරන ලදී. දැනට සිදුකරනු ලබන මූලික පරීක්ෂණවලින් ලබාගත් දත්තයන් සහ ඉදිරි සවිස්තරාත්මක අධ්‍යයනයන්ගේ ප්‍රථිඵල මත පදනම් ව නිර්මාණයවන දිගුකාලීන නිරසාර ක්‍රමවේදයක් හඳුන්වාදීමට අත්‍යවශ්‍ය වේ. සවිස්තරාත්මක සැලසුම් ඇතුලත් වාර්තාවක් නුදුරු අනාගතයේ දී නිකුත්කිරීමට නියමිත ය.

කොළඹ වරාය ආසන්නයේ MV X-press Pearl නෞකාවේ ඇතිවූ ගින්න හේතුවෙන් වායු දූෂණය කෙරෙහි ඇතිවූ බලපෑම

කොළඹ වරාය ආසන්නයේ MV X-press Pearl නෞකාවේ ඇතිවූ ගින්න හේතුවෙන් වාතයේ ගුණාත්මකභාවය කෙරෙහි ඇතිවූ බලපෑම තක්සේරු කිරීම සඳහා තාක්ෂණික සහාය ලබාදෙන ලෙස ශ්‍රී ලංකා සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය (MEPA) විසින් සිදුකරන ලද ඉල්ලීමක් පදනම් ව, ජා. ගො. ප. සංවිධානය විසින් බලපෑමට ලක්වූ ප්‍රදේශය තුල වාතයේ ගුණාත්මකභාවය පිළිබඳ පුළුල් අධ්‍යයනයක් සිදුකරන ලදී.

නෞකාව ගිනි ගැනීමෙන් පසුව, නෞකාවේ ගබඩා කර තිබූ බොහෝ රසායනික ද්‍රව්‍ය සහ අනෙකුත් ද්‍රව්‍ය වියෝජනය වීමෙන් රසායනික වාෂ්ප සහිත දුම මෙන් ම එම ද්‍රව්‍යවල සංයුතිය අනුව දහන නිෂ්පාදනයන් හේතුවෙන් බිහිවන වායු දූෂක නිර්ණායකයන් වායු ගෝලයට මුදහැරීම සිදු විය. මෙම ගින්න මඟින් ඩයොක්සීන, ෆියුරාන් සහ අනෙකුත් කාබනික දූෂක මෙන් ම අන්තරායකාරී බැර ලෝහයන් ද ඊට අමරතර ව, කාබන් ඩයොක්සයිඩ හරිතාගාර වායූන් ද, දහන ද්‍රව්‍යයන් හි ස්වභාවය හා දැල්ලේ උෂ්ණත්වය අනුව වායු ගෝලයට මුදු හැරීමේ හැකියාවත් ඇති විය හැකි ව ඇත. නිකුත් වූ වායු දූෂකයන් අවට පරිසරයේ කාලගුණික තත්ත්වය අනුව විසිරීයාම සිදුවී ඇත.

මෙම විශේෂිත ගිනි ගැනීම අතරතුර සිදුකරන ලද නිරීක්ෂණවලට අනුව බටහිර සහ නිරිත දෙසින් සුළං පවනිනවිට ජනිතවූ වායු දූෂක ද්‍රව්‍ය පිහාටුවක් ලෙස අභ්‍යන්තර ප්‍රදේශයන් වෙත විසිරීයාම සිදුවිය. ලබාගන්නා ලද මිනුම්වල ප්‍රථිඵල අනුව නෞකාව ආසන්න ප්‍රදේශවල ඉහල පරිසර දූෂණ මට්ටමක් පෙන්නුම් කළ අතර තීරණාත්මක ලෙස කලින් හඳුනාගත් ප්‍රදේශවල සැලකිය යුතු මට්ටමේ වාර්තාවීමක් සිදු නොවී ය. අඛන්ඩ අධීක්ෂණ දත්තයන් මඟින් දර්ශනය වී ඇත්තේ වෙනස්වන කාලගුණික තත්ත්වයන් සමඟ ජාතික සම්මත මට්ටමට වඩා ඉහල පරිසර දූෂණ මට්ටම පැවතී ඇත්තේ පැය කීපයක් තුල දී පමණක් බව යි.



ගිත්තෙත් ජනතයවත බිම් මට්ටමේ දූෂකවල සාන්ද්‍රණය තක්සේරු කිරීම සඳහා වායු තත්ත්ව විසරණ ආකෘති මෘදුකාංගය භාවිතා කිරීම සිදුකරන ලදී. මෙම ආකෘතිකරණය මඟින් පෙන්නුම් කරන ලද්දේ ගිත්ත මඟින් ඇතිකල දැයකත්වය නිසා පරිසර දූෂක මට්ටමේ දෙගුණයක් වැඩිවී ඇති බවත්, කොවිඩ් 19 නිසා අගුලු දැමීමේ තත්ත්වය හේතුවෙන් මේවනවිට අවට වායු දූෂක මට්ටම ඉතා පහල අගයක වූ බැවින් පුරෝකතනය කල මට්ටම් සම්මත මට්ටම් තුල හොඳින් පවතින බව යි. MV X-press Pearl නෞකාවේ සිදුවූ මෙම සිදුවීමෙන් පිළිස්සීගිය ස්කන්ධයේ ප්‍රමාණය අනුව වායු දූෂක ද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 8000 ක් 13000 ක් අතර ප්‍රමාණයක් වායු ගෝලයට මුදහැර ඇති බව බර ගණනය කිරීමේ දත්ත පෙන්වා දෙයි.

වෙනත් ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්

නායයෑම් අධ්‍යයන හා සේවා, භූ තාක්ෂණික ඉංජිනේරු, ව්‍යාපෘති කළමනාකරණ සේවා, ගොඩනැගිලි ද්‍රව්‍ය, මානව ජනාවාස සැලසුම්කරණය සහ පාරිසරික කළමනාකරණය යන ක්ෂේත්‍රවල තාක්ෂණික පරීක්ෂණ සහ උපදේශන සේවා සැපයීම පහත වගුවෙහි සාරාංශගත කර ඇති පරිදි අඛණ්ඩ ව සිදුකර ඇත.

ක්‍රියාකාරකම/අංශය	උපදේශන කාර්යයන් සංඛ්‍යාව	පරීක්ෂණ/ විමර්ශන කටයුතු සංඛ්‍යාව	උත්පාදනය කරන ලද ආදායම (රු. මි.)
නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ අංශය	1075	-	100.62
භූ තාක්ෂණික ඉංජිනේරු හා පරීක්ෂණ අංශය	231	137	160.91
පාරිසරික අධ්‍යයන හා සේවා අංශය	312	389	52.80
ගොඩනැගිලි ද්‍රව්‍ය පර්යේෂණ හා පරීක්ෂණ අංශය	4	2649	40.46
ව්‍යාපෘති කළමනාකරණ අංශය	25	120	32.90
මානව ජනාවාස සැලසුම් හා පුහුණු අංශය	2	42	15.83
උපදේශන කටයුතු - RLVMM ව්‍යාපෘතිය			66.10
වෙනත් ආදායම්	-	-	53.80
එකතුව			**523.42**

විදේශීය/දායකත්ව සහයෝගිතා සහිත ව්‍යාපෘතීන්

ජා. ගො. ප. සංවිධානය - ජයිකා තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතිය (විදේශීය ආධාර සහ තාක්ෂණික සහයෝගිතාව)

- **නායයෑම් අවමකිරීමේ ව්‍යාපෘති සඳහා තාක්ෂණික සහයෝගිතාවය (TCLMP- අදියර I සහ II)**

අවදානම් සහිත ස්ථාන 4 ක අවදානම අවමකරණ කටයුතු (බදුළුසිරිගම නායයෑම් අඩවිය, උඩමාදුර - මහතුවර සහ අලගුමලේ පාෂාණ පතිතවීම සහිත අඩවිය) නායයෑම් අවමකිරීම සඳහා ජයිකා තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතිය (TCLMP) අදියර 1 යටතේ නිමාවට පත් කර ඇත. ව්‍යාපෘති කටයුතු ජා. ගො. ප. සංවිධානය Koiwa Corporation and Earth System Science ආයතනය සමඟ සිදුකල අතර Nippon Koei උපදේශක වශයෙන් ක්‍රියා කරන ලදී.

TCLM ව්‍යාපෘතියෙහි II අදියර "SABO" ව්‍යාපෘතිය ලෙස හැඳින්වෙන ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ නායයෑම් අවදානම අවමකිරීම සඳහා ව්‍යුහාත්මක නොවන පියවරයන් සංවර්ධනය කිරීම සඳහා ධාරිතාව ශක්තිමත් කිරීම, ඉලක්ක කරගත් තෙවසරක ව්‍යාපෘතියකි. අවදානම් තක්සේරු කිරීම, ප්‍රාදේශීය මට්ටමින් නායයෑම් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් නිකුත්කිරීම, පවතින නිරීක්ෂණ පද්ධතිය සහ අනතුරු ඇඟවීම් වැඩිදියුණු කිරීම සහ අවසාදිත ආපදා පිළිබඳ අවදානම් තක්සේරු කිරීම, ඉඩම් පරිහරණ සැලසුම් සහ සංවර්ධන ප්‍රතිපත්ති භාවිතය මේ යටතේ ඉලක්ක කර ආරම්භ කර ඇත. ආරම්භයේ දී කෑගල්ල, බදුල්ල සහ මාතර යන ප්‍රදේශවලින් නියමු ස්ථාන තුනක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගෙන ඇත. ව්‍යාපෘතියේ ඉලක්කගත නිමැවුම් සාක්ෂාත් කරගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරී කණ්ඩායම් තුනක් පත්කර ඇත.

පළමු ක්‍රියාකාරී කණ්ඩායම (WG1) - උපද්‍රව විශ්ලේෂණය සහ අවදානම් තක්සේරුව
දෙවන ක්‍රියාකාරී කණ්ඩායම (WG2) - නායයෑම් ආපදා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය
තෙවන ක්‍රියාකාරී කණ්ඩායම (WG3) - ඉඩම් පරිහරණ සැලසුම් සහ සංවර්ධන ප්‍රතිපත්ති

පළමු ක්‍රියාකාරී කණ්ඩායම (WG1) යටතේ නායයෑම් උපද්‍රව කළාප සිතියම් සහ අවදානම් තක්සේරු කිරීම පිළිබඳ ව පවතින ක්‍රමවේදය සමාලෝචනය කිරීම, නායයෑම් ආපදා වාර්තා කළමනාකරණය සඳහා පද්ධතියක් වැඩිදියුණු කිරීම පසුගිය නායයෑම් ආපදා පිළිබඳ වාර්තා රැස්කිරීම හා විශ්ලේෂණය කිරීම, අඩවි විශේෂිත සිතියම්ගත කිරීම සහ අවදානම් තක්සේරුකරණය පිළිබඳ කෙටුම්පත් අත්පොතක් සැකසීම, නියාමක අඩවි තුන සඳහා Hyper KANAKO ආකෘතිය භාවිතයෙන් නායයෑම් සුන්බුන් මාර්ග සමාකරණය පැවැත්වීම මඟින් රතු කළාප සහ කහ කළාප සංකල්පය අනුව අඩවි විශේෂිත උපද්‍රව සිතියම් සැකසීම මෙන් ම නියාමක අඩවිවලට අමතර ප්‍රදේශවල ද අඩවි විශේෂිත උපද්‍රව සිතියම්කරණය සිදුකිරීම ද වේ. ඊට අමතර ව ජා. ගො. ප. සංවිධානයේ කාර්යමණ්ඩලය සඳහා වැඩමුළු, පුහුණු හා කුඩා සම්මන්ත්‍රණ පැවැත්වීම ද සිදු කෙරිණ.

2021 වසරේ දී පහත සඳහන් කාර්යයන් සිදුකරන ලදී: කහ/රතු කළාප සීමා නැවත නිර්මාණය කිරීමේ ක්‍රමවේදය ස්වයංක්‍රීය කිරීම, ජා. ගො. ප. සංවිධානයෙහි නායයෑම් උපද්‍රව සිතියම් මත පදනම් ව කහ/රතු කළාප සීමා කිරීමේ ක්‍රමවේදය යාවත්කාලීන කිරීම, නියමු අඩවි තුනක කහ/රතු සිතියම් යාවත්කාලීන කිරීම, අඩවි විශේෂිත කෑගල්ල දිස්ත්‍රික්කයේ තෝරාගත් ස්ථාන 12 ක් සඳහා උපද්‍රව සිතියම්ගත කිරීම, නියමු ස්ථාන තුනක කහ/රතු කළාප සිතියම් ක්ෂේත්‍ර සත්‍යාපනය කිරීම සහ අනෙක් ස්ථාන 12 ක අඩවි සඳහා අවසන් කහ/රතු කළාප සිතියම් කෑගල්ල දිසාපතිවරයා වෙත ඉදිරිපත්කිරීම.



මොරවක්කන්ද නියමු අඩවියේ විශේෂිත උපද්‍රව ප්‍රතිදානය



වීරියපුර නියමු අඩවියේ විශේෂිත උපද්‍රව ප්‍රතිදානය

දෙවන ක්‍රියාකාරී කණ්ඩායම (WG2) : ජා. ගො. ප. සංවිධානය විසින් නායයෑම් පූර්ව අනතුරු ඇඟවීම් ක්‍රියාවලියෙහි වැඩිදියුණු කිරීම් කිහිපයක් සිදුකර නායයෑම් පූර්ව අනතුරු ඇඟවීම් නිකුත්කිරීමේ කාර්යක්ෂමතාවය හා වර්ෂාපතන නිරීක්ෂණ කටයුතු වර්ධනය කිරීම සඳහා ක්‍රියාකර ඇත. පසුගිය නායයෑම් විමර්ශන වාර්තා ආශ්‍රයෙන් හා පවතින අතෙකුත් මූලාශ්‍රයන් භාවිතයෙන් නායයෑම් විස්තර තොරතුරු පද්ධතියක් සකසා ඇති අතර නායයෑම් ප්‍රවනතාවයක් සහිත සියලුම දිසත්‍රික්ක 12 සඳහා ම 'වර්ෂාපතන ප්‍රශස්ත' අගයයන් ගණනය කිරීමේ කටයුතු සිදුකර ඇත. මෙම අධ්‍යයනය තුල පැය 24, 48, 72 එක් පැයක 'වර්ෂාපතන සීමා' අගයයන් සහ පාංශු ජල දර්ශක අගයයන් ව්‍යුත්පන්න කිරීම ඉහත සියලුම කළාපයන් සඳහා සිදුකර ඇත. නායයෑම් පූර්ව අනතුරු ඇඟවීම් නිකුත්කිරීම සඳහාවන තීරණාත්මක රේඛාව කෙටි කාලීන වර්ෂාව සහ දීර්ඝ කාලීන වර්ෂා අගයයන් සංයුක්ත කිරීම භාවිතයෙන් සිදුකරනු ලබයි. කෑගල්ල දිස්ත්‍රික්කයේ උඩපොත සහ බදුල්ල දිස්ත්‍රික්කයේ වීරියපුර යන ස්ථානවල නායයෑමේ චලනයන් හඳුනාගැනීමේ සහ අධීක්ෂණය කිරීමේ උපකරණ සවිකර ඇති අතර OSASI පද්ධතිය හරහා අගයයන් නිරීක්ෂණය කිරීමේ හැකියාව ඇත. ශ්‍රී ලංකාවේ නායයෑම් අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා මාර්ගගත නායයෑම් තොරතුරු කළමනාකරණ පද්ධතිය සංවර්ධනය කර ඇත.

තෙවන ක්‍රියාකාරී කණ්ඩායම (WG3) යටතේ ව්‍යාපෘතිය මඟින් කහ/රතු කළාප මඟින් නම්කරන ලද ප්‍රදේශයේ සුදුසු ඉඩම් පරිහරණය සහ අවශ්‍ය රාජ්‍ය සහ ප්‍රාදේශීය ප්‍රයත්නයන් පිළිබඳ ව සාකච්ඡාකර ඇත. උදාහරණ වශයෙන් කහ කළාපයේ පූර්ව අනතුරු ඇඟවීම් සහ ප්‍රදේශයෙන් ඉවත්කිරීමේ ක්‍රමවේදය ශක්තිමත් කිරීම මධ්‍යම හා ප්‍රාදේශීය රාජ්‍ය අංශයන් විසින් සිදුකළ යුතු ය. රතු කළාපයන් තුලට තව අවදානම් තත්ත්වයන් ඇති නොවන ලෙස අලුතින් ගොඩනැගිලි ඉදිකිරීම් සහ/හෝ මහජන පහසුකම් පාලනය කළ යුතු ය.

මෙම සාකච්ඡාවන් ප්‍රාදේශීය අධිකාරීන්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මෙන් ම නාගරික සංවර්ධන අධිකාරිය වැනි මධ්‍යම සංවර්ධන ආයතනය යන ආයතන සමඟ සිදුකිරීමට අපේක්ෂා කර ඇත. එමෙන් ම කහ/රතු කළාප ආශ්‍රිත ව කුමන ආකාරයේ ව්‍යුහාත්මක ක්‍රියාමාර්ග කළාපය තුල සංවර්ධන පිරිවිතරයන් 'ආපදාවන්ට ඔරොත්තු දෙන ඉඩම් පරිහරණ රෙගුලාසි/සංවර්ධන පිරිවිතරයන් හි රටතුල නායයෑම්වලට ලක්විය හැකි ප්‍රජාවන් සඳහා භාවිතය පිණිස සාරාංශ ගත කෙරනු ඇත.

ශ්‍රී ලංකාව තුල වර්ෂාව නිසා ප්‍රේරිත වේගවත් හා දිගුදුර නායයෑම් පිළිබඳ අනතුරු හැඟවීම් තාක්ෂණය සංවර්ධනය කිරීම - SATREPS (JICA)

ජාත්‍යන්තර නායයෑම් සම්මේලනය (ICL) සමඟ ජා. ගො. ප. සංවිධානය ඒකාබද්ධ ව තිරසාර සංවර්ධනය සඳහා විද්‍ය හා තාක්ෂණ පර්යේෂණ සහයෝගිතාවය (SATREPS) යටතේ ජපාන විද්‍ය හා තාක්ෂණික ආයතනය (JST) හා සමගාමී ව 'වැසි ප්‍රේරිත වේගවත් දිගුදුර නායයෑම් පිළිබඳ ආපදා අවදානම අවමකිරීම' නමින් යුත් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම පස් අවුරුදු ජපන් ශ්‍රී ලංකා ඒකාබද්ධ ව්‍යාපෘතිය 2019 – 2023 කාලය තුල ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය හිමි විය. මෙම යෝජනා මගින් වැසි ප්‍රේරිත වේගවත් සහ දිගුදුර නායයෑම් ආපදා අවදානම අවමකිරීම සඳහා 2015 – 2025 ගෝලීය සෙන්ඩායි සහයෝගීතාවයේ පාර්ශවකරුවන් හරහා උසස් තාක්ෂණය හඳුන්වාදීමට යෝජනා කරයි. මෙම ව්‍යාපෘති කටයුතු සඳහා දේශීය සහ ජපන් සහයෝගිතා හා උපකාරක කටයුතු දැනටමත් ආරම්භ කර ඇත. අපේක්ෂිත ප්‍රතිඵලයන් වන්නේ

1. අධික වර්ෂාපතනය සහ එහි ප්‍රතිඵලයක් ලෙස භූගත ජල පීඩනය වැඩිවීම පිළිබඳ පැය 24 කට පෙරාතු ව පුරෝකතනය කිරීමේ තාක්ෂණය සංවර්ධනය කිරීම. වර්ෂාව නිසා ප්‍රේරිත නායයෑම් ස්ථාන සහ ඒවායේ චලනයවන කළාප හඳුනාගැනීම සංවර්ධනය කිරීම.
2. කඳුකර සහ ප්‍රාදේශීය නගර ආශ්‍රිත ව ජීවත්වන ප්‍රජාවන් හි ජනතාව වෙත ඵලදායී අවදානම් සන්නිවේදන තාක්ෂණික රාමුවක් හා තාක්ෂණය සංවර්ධනය කිරීම
3. නියමු අධ්‍යයන අඩවි තුල ඒකාබද්ධ පර්යේෂණ පදනම් කරගනිමින් වැසි මඟින් ප්‍රේරණයවන දිගු දුර නායයෑම් පිළිබඳ අනතුරු ඇඟවීමේ පද්ධතියක් සංවර්ධනය කර ඇති අතර ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රදේශවල භාවිතය සඳහා මාර්ගෝපදේශ සහ අත්පොතක් සහිත සංවර්ධිත පද්ධතියක් ඉදිරිපත් කිරීම.
4. දියුණු කරන ලද ඉහත තාක්ෂණයන් නායයෑම් සහ ඒ ආශ්‍රිත උවදුරුවලින් අවදානමට ලක්ව ඇති ප්‍රජාවන් හා ජනතාවගේ ආරක්ෂාව සුරක්ෂිතභාවය සහතික කරනු ඇත.

ව්‍යාපෘති කාර්යාලයක් ටෝකියෝ හි ස්ථාපනය කරන ලද අතර ජා. ගො. ප. සංවිධානයේ විද්‍යඥයින් හතරදෙනෙකු ධාරිතාව සංවර්ධනය යටතේ ජපානයේ දී පුහුණු කිරීම සිදුකෙරේ. පාර්ශවකරුවන් සඳහාවන තවත් පුහුණු වැඩසටහන් සැලසුම්කර ඇති අතර පුහුණු වැඩසටහන් සඳහා ඇතැම් විද්‍යඥයින් මේවන විටත් තම්කර ඇත. භූ තාක්ෂණ ඉංජිනේරු අංශයේ පර්යේෂණාගාරය සඳහා නායයෑම් සමාකරණ උපකරණ වැනි සංකීර්ණ උපකරණ සැපයීම මඟින් ශක්තිමත් කර ඇත.

අවමකිරීමේ ක්‍රමවේදයන් තුලින් නායයෑම් අවදානම් අවමකිරීමේ ව්‍යාපෘතිය (RLVMMP)

අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ඒකාබද්ධ නායයෑම් අවමකිරීමේ වැඩසටහනින් ආරම්භවී ජා. ගො. ප. සංවිධානය විසින් 'අවමකරණ ක්‍රියාමාර්ග තුලින් නායයෑම් අවදානම අවමකිරීමේ ව්‍යාපෘතිය' (RLVMMP) ආරම්භ කරන ලදී. වසර 5 ක් පුරා ක්‍රියාත්මක මෙම මහාපරිමාණ ව්‍යාපෘතිය සඳහා හඳුනාගත් අධි අවදානම් අඩවි මෙන් ම මාර්ග ආශ්‍රිත අස්ථායී බෑවුම් හා උඩරට දුම්රිය මාර්ගය ආසන්න අස්ථාවර බෑවුම් ආශ්‍රිත අවමකිරීමේ කටයුතු ඇතුලත් වේ. මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන සංරචකයන් වන්නේ,

- සිවිල් වැඩ සහ ඒ ආශ්‍රිත සැලසුම් සහ ඉදිකිරීම් අධීක්ෂණ/කළමනාකරණ
- ප්‍රතිපත්ති සහ නියාමනය වැඩිදියුණු කිරීම
- ආයතනික ධාරිතාව ගොඩනැඟීම
- තාක්ෂණික සහාය සහ ව්‍යාපෘති කළමනාකරණය

ජා. ගො. ප. සංවිධානය විසින් පළාත් පාලන ආයතන, මාර්ග සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ ව වහාම අවමකිරීම් අවශ්‍යවන ස්ථාන 147 ක් සඳහා ප්‍රමුඛත්වය ලබාදී ඇත.

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතිවල කාර්යමණ්ඩලය සමඟ ජා. ගො. ප. සංවිධානයේ සහායක කාර්යමණ්ඩලයේ ද සහාය ඇතිව තම කාර්යභාරය අඛන්ඩ ව ඉටුකරනු ලබයි.

පළාත	දිස්ත්‍රික්කය	වැඩබිම් සංඛ්‍යාව
මධ්‍යම	මහනුවර	18
	මාතලේ	12
	නුවරඑළිය	14
වයඹ	කුරුණෑගල	04
සබරගමුව	කෑගල්ල	18
	රත්නපුර	32
දකුණ	මාතර	06
ඌව	බදුල්ල	20
බස්නාහිර	කොළඹ	01
	කළුතර	22
එකතුව		147



2021 වසර අවසානයේ දී පළමු අදියරේ පැකේජ 1, 2, 3, **4**A, 4B සහ 4C තෝරාගත් කොන්ත්‍රාත්කරුවන් වෙත ප්‍රදානය කර ඇති අතර රත්නපුර, කළුතර, මාතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල සහ කොළඹ දිස්ත්‍රික්ක තුල, ප්‍රදේශවල නායයෑම් ස්ථාන 24 ක ඉදිකිරීම් කටයුතු ආරම්භකර ඇත. අදියර II යටතේ පැකේජ 7 සඳහා සිවිල් වැඩ කොන්ත්‍රාත්තු ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භකර ඇති අතර 2022 වසර මැද භාගයවන විට කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමට නියමිත ව ඇත. අදියර II හි පැකේජ 5 හි විමර්ශන සහ සැලසුම්කිරීමේ අදියරයන් අවසන්කර ඇති අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2022 මුල් භාගයේ දී ආරම්භ කිරීමට නියමිත ව ඇත.



නායයෑම් අවමකිරීමේ වැඩබිම් දුරේකන්ද (වම) ගලබොඩ (මැද) සහ අයගම (දකුණ) රත්නපුර දිස්ත්‍රික්කය

MOBILISE 3.0 : ප්‍රත්‍යස්ථිතික ප්‍රජාවන් ගොඩනැඟීම සඳහා ඩිජිටල් මෙවලම් කට්ටලය

දේශීය ආයතනවලට සහ ප්‍රජාවන්හට උපකාර කළහැකි උසස් ඩිජිටල් විසඳුම් මාලාවක් අත්හදබැලීම සඳහා කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ එක්සත් රාජධානියේ සල්ෆර්ඩ් විශ්වවිද්‍යාලය සමඟ එක් ව දේශගුණික ප්‍රේරිත නායයෑම් හා ගංවතුර වැනි විපත්වලට දේශීය වශයෙන් ඔවුන්ගේ ඔරොත්තුදීමේ හැකියාව ගොඩනැඟීම සඳහා උසස් ඩිජිටල් විසඳුම් සමූහයක් අත්හද බැලීම පිණිස නවෝත්පාදනයන් සඳහාවන ප්‍රදානයක් (රු. මිලියන 30) ලබාගැනීමට ජා. ගො. ප. සංවිධානය මෑතක දී සමත් ව ඇත.

ලෝක බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන දේශගුණික විපර්යාස සඳහා ආසියානු ඔරොත්තුදීමේ වැඩ සටහනෙහි (PARCC) සහ එක්සත් රාජධානියේ විදේශ පොදු රාජ්‍ය මණ්ඩලීය හා සංවර්ධන කාර්යාලය (FCDO) විසින් අරමුදල් සපයනු ලබන එමෙන් ම ආසියානු ආපද පෙරසූදානම් මධ්‍යස්ථානය (ADPC) විසින් පරිපාලනය කරනු ලබන ව්‍යාපෘතියේ අංගයක් ලෙස මෙම ප්‍රදානය හිමි ව ඇත. ජා. ගො. ප. සංවිධානය විසින් ජයග්‍රහණය කරන ලද මෙම නවෝත්පාදන ව්‍යාපෘතිය ආසියානු පෙරසූදානම් මධ්‍යස්ථානය විසින් මෙහෙයවනු ලබන දේශගුණික විපර්යාස නවෝත්පාදන අභියෝගයන් සඳහා ඉදිරිපත් කරන ලද තරඟකාරී යෝජනා 236 අතුරින් තෝරාගත් ජයග්‍රාහී ව්‍යාපෘති 16 න් එකකි.


Figure : Professor Terrance Fernando explains the project to the District Secretary and the team.

දේශගුණික විපත් සඳහා සූදානම්වීමේ වත්මන් ප්‍රවේශයන් හි සීමාවන් මඟහරවාගැනීම සඳහා එක්සත් රාජධානියේ සැල්ෆර්ඩ් විශ්වවිද්‍යාලයෙහි THINKlab ආයතනය විසින් සංවර්ධනය කරන ලද ඩිජිටල් විසඳුම් මාලාවක් අත්හදබැලීම මෙම ව්‍යාපෘතියෙහි අරමුණ යි. ශ්‍රී ලංකාව වැනි බොහෝ රටවල් මුහුණ දෙන ප්‍රධාන අභියෝගය නම් දේශීය ආපදා අවදානම අවමකිරීමේ ක්‍රියාකාරකම්වලට විසඳුම් සෙවීම සඳහා බුද්ධි ම ය ප්‍රවේශයක් නොමැතිවීමයි. වර්තමානයේ වැදගත් දේශගුණික හා ආපදා අවදානම් දත්ත බොහෝ රාජ්‍ය ආයතනවල විසිරී පවතී. එහි ප්‍රතිඵලයක් ලෙස දේශගුණික විපර්යාසවලට එරෙහි ව ප්‍රජාවන්ගේ ඔරොත්තුදීමේ හැකියාව ගොඩනැඟීමට සහ ඵලදායී පූර්ව අනතුරු ඇඟවීම් නිකුත්කිරීමට අවශ්‍ය ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් රාජ්‍ය ආයතනවලට අදාළ බුද්ධි ම ය නොරතුරු සම්පාදනය කිරීම අපහසු ය.

මෙම ඩිජිටල් නවෝත්පාදන ව්‍යාපෘතියේ අරමුණ වන්නේ දේශීය අවදානම් හඳුනාගැනීම සහ අනුවර්තනය මෙන් ම අවදානම් අවමකිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ ව එකඟවීම සඳහා කළුතර ප්‍රදේශයේ දේශීය නියෝජිතායතන සඳහා හවුල් අවදානම් නොරතුරු සමුදායක් හා දත්ත පදනම් කරගත් තීරණ ආධාරක පද්ධතියක් ස්ථාපනය කිරීම යි. තව ද, මෙම ව්‍යාපෘතිය මඟින් සංවර්ධනය කරන ලද ඩිජිටල් විසඳුම් මඟින් ප්‍රජාවට පදනම් වූ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් අත්හදා බලනු ලබන අතර එහිදී ප්‍රජාවන්ට සමූහ මූලාශ්‍ර ශිල්පීය ක්‍රම හරහා අදාළ නිලධාරීන් වෙත වැදගත් බුද්ධි ම ය නොරතුරු ලබාදිය හැකි අතර සිදුවිය හැකි ආපදා අවදානම් පිළිබඳ ව කල් ඇතිව අනතුරු ඇඟවීමේ හා ඒ තුළින් ජීවිත බේරාගැනීම් සිදුකළ හැක. ජංගම දුරකතන සංඥා කලාපයෙන් බැහැර ප්‍රජාවන් වෙත පූර්ව අනතුරු ඇඟවීමේ පණිවුඩ ලබාදීම සඳහා මෙම ව්‍යාපෘතිය මඟින් 'සුහුරු නගර විසඳුම්' පිළිබඳ ගවේෂණය කරනු ඇත.

ජා. ගො. ප. සංවිධානයේ ප්‍රකාශන

ඉලෙක්ට්‍රොනික පුවත් පත්‍රිකා ප්‍රකාශන

2021 වසරේ දී ඉලෙක්ට්‍රොනික පුවත් පත්‍රිකා 6 ක් ප්‍රකාශයට පත්කර ඇත. මෙම ප්‍රකාශනයන් තුල
(i) කාල සීමාව තුල සිදුකරන ලද කාර්යයන් ප්‍රකාශයට පත්කිරීම
(ii) දිනපතා ඉදිරිපත්කිරීම් වාර්තා සහ ඒවායේ ප්‍රතිඵලයන්
(iii) කණ්ඩායම් අදහස් සාකච්ඡා
පහත සඳහන් සබැඳියන් ඔස්සේ පුවත් ප්‍රකාශන වෙත ප්‍රවේශ විය හැක;

https://publicate.it/p/4.mRqq246286
https://publicate.it/p/0998SG242457
https://publicate.it/p/mV6P.C244954
https://publicate.it/p/UqK9Qj244057
https://publicate.it/p/4.mRqq246286
https://publicate.it/p/_w20UV241436







තාක්ෂණික පත්‍රිකා ප්‍රකාශයට පත්කිරීම







https://www.nbro.gov.lk/images/download/symposium/NBRO_11th_Annual_Research_Symposium_Proceedings---2021.pdf
https://drive.google.com/file/d/1sPbumXD0JfEQPBvCB17-KI8cH_BG_Rfa/view

මූල්‍යමය විශේෂ අවස්ථා

2021 වසර තුල ජා. ගො. ප. සංවිධානය රු. මිලියන 860.26 ක ඒකාබද්ධ අදයමක් වාර්තාකර ඇත. ජා. ගො. ප. සංවිධානයෙහි 2021 වසරේ සේවා සැපයීම තුලින් ලද ආදයම රු. මිලියන 523.42 කි. ආයතනයේ බොහෝ දුරට මෙම උපදේශාත්මක ආදයම තුලින් තම වර්තමාන පුනරාවර්තන පිරිවැය අවශ්‍යතා සපුරාගැනීම සිදුකරයි.

2021 වසරේ දී රාජ්‍ය ප්‍රතිපාදන යටතේ වන ව්‍යාපෘති හා වැඩසටහන් වෙනුවෙන් රු. මිලියන 336.84 භාවිතාකර ඇත. 2011 මාර්තු මාසයේ සිට දිස්ත්‍රික් කාර්යාල 9 ක් නායයෑම් තැඹුරුතාවයක් සහිත දිස්ත්‍රික්ක තුල සංවර්ධන කටයුතුවලට ප්‍රථම නායයෑම් අවදානම් වාර්තා නිකුත් කිරීම සඳහා ක්‍රියාත්මක වෙමින් පවතී. පුනරාවර්ථන වියදම් වශයෙන් භාණ්ඩාගාරයෙන් රු. මිලියන 35.0 ක් සපයන ලද අතර ශේෂය සේවාලාභීන් වෙතින් අයකරනු ලබන නාමික ගාස්තු මඟින් හා ජා. ගො. ප. සංවිධානයේ ආදයම තුලින් පියවාගැනීම කටයුතු කර ඇත.



2021 වසරේ රාජ්‍ය ප්‍රතිපාදන ව්‍යාපෘති



පරීක්ෂණ හා උපදේශනයන් මඟින් ලද ආදයම



මුලු මෙහෙයුම් ආදායම හා ශුද්ධ අතිරික්තය



2016 – 2021 කාලය තුල උපයන ලද ශුද්ධ

ඊට අමතර ව නායයෑම් ආපද සිතියම්ගත කිරීම් සඳහා රු. මිලියන 26.6 ක් ද පර්යේෂණ හා සංවර්ධන සඳහා රු. මිලියන 14.64 ක් ද නායයෑම් විශේෂ විමර්ශන සඳහා රු. මිලියන 78.0 ක් ද පර්යේෂණාගාර හා ක්ෂේත්‍ර කාර්යාල ප්‍රසම්පාදනය සඳහා රු. මිලියන 3.88 ක ප්‍රතිපාදනයන් ද භාණ්ඩාගාරය වෙතින් හිමි විය.

2021 වසරේ ඒකාබද්ධ ආදයම රු. මිලියන 860.2 ක් වූ අතර අදාල කාලපරිච්ඡේදය සඳහා ඒකාබද්ධ පිරිවැය රු. මිලියන 789.8 ක් විය. ඒ අනුව රු. මිලියන 70.4 ක ශුද්ධ ලාභයක් වාර්තා විය.

438 දෙනෙකුගෙන් ශක්තිමත් කාර්යයමණ්ඩලය ඇතුලු දෛනික වේතනයන් ලබන සේවකයන්ගේ දීමනාවන් වෙනුවෙන් රු. මිලියන 406.9 ක පිරිවැයක් 2021 වසරේ දී දරා ඇති අතර 2020 වසරේ දී කාර්යයමණ්ඩල ශක්තිය 490 සහ දෛනික වේතනයන් ලබන සේවකයන් ද ඇතුලු ව මෙම අගය රු. මිලියන 455.0 ක් විය.

ආයතනික වර්ධනය සහ වැඩිදියුණු වූ කාර්යසාධනය ප්‍රධාන වශයෙන් ජා. ගො. ප. සංවිධානයෙහි කළමනාකාරීත්වයේ සහ කාර්යමණ්ඩලයෙහි ධෛර්යමත් උත්සාහයේ ප්‍රතිඵලයකි.

මූල්‍යමය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

රු.

	ඇමුණුම් අංකය	31.12.2021 දිනට		31.12.2020 දිනට
ජංගම වත්කම්				
මුදල් සහ ඒ ආශ්‍රිත වත්කම්	1		228,837,920	94,773,584
ලැබීමට නියමිත ව්‍යාපෘති ණයගැතියන්	2	65,763,151		61,020,416
විවිධ ලැබීම්	3	27,159,302	92,922,453	28,881,574
			321,760,373	**184,675,574**
ඉන්වෙන්ට්‍රි	4		4,339,085	3,410,241
කාර්යමණ්ඩලයෙන් ලැබීම්	5		98,976,955	101,092,773
පෙර ගෙවීම්	6		51,950,721	135,922,914
වෙනත් ජංගම වත්කම්				
සිදුවෙමින් පවතින ව්‍යාපෘති	7	183,777,832		104,284,321
කාලීන තැන්පතු	8	443,621,164	627,398,996	469,321,082
ජංගම නොවන වත්කම්			**1,104,426,128**	**998,706,906**
යටිතල, පිරියත සහ උපකරණ	9	133,404,828		168,435,039
නව විද්‍යාගාර ගොඩනැගිල්ල නොනිමි වැඩ		540,050,649		391,734,775
කුඩා රසායනාගාර කටයුතු නොනිමි වැඩ		22,006,166	695,461,643	3,928,967
මුලු වත්කම්			**1,799,887,771**	**1,562,805,687**
වගකීම්				
ජංගම වගකීම්				
ගෙවීමට ඇති සේවාදායකයන්ගෙන් ලැබූ මුදල්	10	516,527,805		319,910,612
විවිධ ගෙවීම්	11	106,807,992	623,335,797	116,845,313
ජංගම නොවන වගකීම්				
දීර්ඝ කාලීන ප්‍රතිපාදන				
පාරිතෝෂික වෙන්කිරීම්	12	84,698,369	84,698,369	103,644,192
මුලු වගකීම්			**708,034,166**	**540,400,117**
ශුද්ධ වත්කම්			**1,091,853,605**	**1,022,405,569**
ශුද්ධ වත්කම් / ප්‍රාග්ධනය				
රජයේ සහ වෙනත් ආයතනවලින් දායක කරන ලද ප්‍රාග්ධනය	13	587,718,088		588,731,489
වෙන්කිරීම් –අතිරික්තය නැවත ගණනය		27,875,989		27,875,989
පවරාගත් වත්කම්		2,264,498	617,858,575	2,264,498
සමුච්චිත අතිරික්තය/ (ඌනතාව)				
ඉදිරියටගෙන ආ අතිරික්තය	14	403,533,592	403,533,592	373,363,926
වර්ෂය සඳහා අතිරික්තය			70,461,437	30,169,666
ශුද්ධ වත්කම් / ප්‍රාග්ධනය			**1,091,853,605**	**1,022,405,569**

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය රු.

ආදායම	ඇමුණුම්	2021 වර්ෂය	2021 වර්ෂයේ සංශෝධිත අයවැය	2020 වර්ෂය
ආදායම				
පාරිසරික අධ්‍යයන සහ සේවා අංශය	**15**	69,555,218	65,000,000	66,284,071
භූ තාක්ෂණික ඉංජිනේරු සහ පරීක්ෂණ අංශය	**16**	221,030,070	259,750,000	157,524,997
නායයෑම් පර්යේෂණ සහ අවදානම් කළමනාකරණ අංශය	**17**	262,015,907	251,200,000	226,452,921
මානව ජනාවාස සැළසුම් සහ පුහුණු අංශය	**18**	72,147,579	72,300,000	64,031,993
ගොඩනැගිලි ද්‍රව්‍ය අංශය	**19**	46,784,101	50,750,000	35,505,706
ව්‍යාපෘති කළමනාකරණ අංශය	**20**	134,924,942	214,000,000	167,890,127
සම්පූර්ණ මෙහෙයුම් ආදායම		**806,457,817**	**913,000,000**	**717,689,815**
වෙනත් ආදායම්	**21**	53,809,691	30,000,000	53,654,050
මුලු ආදායම		**860,267,508**	**943,000,000**	**771,343,865**
අඩුකළා: වියදම්				
වැටුප්, පඩිනඩි හා සේවක ප්‍රතිලාභ	**22**	406,993,732	511,021,322	454,787,074
භාවිතා කරන සැපයුම් සහ පරිභෝජන	**23**	269,483,120	304,692,350	235,814,360
ක්ෂය වීම	**24**	60,338,586	8,000,000	6,478,138
දේපළ ඌනතා, පිරියත සහ උපකරණ	**25**	17,251,255	14,546,765	13,065,378
වෙනත් වියදම්	**26**	34,628,738	36,422,240	27,780,767
මූල්‍ය පිරිවැය	**27**	110,640	5,000	48,482
මුලු වියදම		**788,806,071**	**874,687,677**	**737,974,198**
බදුවලට පෙර ශුද්ධ ලාභය		71,461,437	68,312,323	33,369,666
ආදායම් බදු		1,000,000	-	3,200,000
බදුවලට පසු ශුද්ධ ලාභය		**70,461,437**	**68,312,323**	**30,169,666**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

රු.

	2021	2020
අතිරික්තය / (හිඟය)	**70,461,437**	**30,169,666**
ගැලපුම්		
ක්ෂයවීම්	60,338,586	6,478,138
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	-11,629,401	17,539,828
පාරිතෝෂික ගෙවීම	-7,316,420	-7,337,985
ණය ගැනියන් සඳහා අධි/අව ප්‍රතිපාදන	-103,971	1,520,492
විනිමය නොවන ආදායම	-18,958,377	-
බැර නොවූ පොලී ආදායම	-25,301,196	-46,168,030
ක්‍රියාකාරී ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර ක්‍රියාත්මක අතිරික්තය (හිඟය)	**67,490,658**	**2,202,110**
ක්‍රියාකාරී ප්‍රාග්ධනයේ වෙනස්වීම්		
ණයගැනියන් වැඩිවීම	20,427,822	-15,734,961
කාර්යමණ්ඩලයෙන් ලැබීම් වැඩිවීම	2,115,818	17,654,105
පෙරගෙවීම් වැඩිවීම	83,972,193	21,865,065
ඉන්වෙන්ට්‍රිවල වැඩිවීම	-928,844	555,606
අත ඇති වැඩවල ප්‍රගතිය වැඩිවීම	-79,493,510	187,895,293
තැන්පතු වැඩිවීම	25,699,918	-5,408,259
සේවාදායකයන්ගෙන් ලැබුණු මුදල්	196,617,192	-194,350,050
විවිධ ණය හිමියන්ගේ වැඩිවීම	-10,037,320	-22,331,949
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලැබුණු ශුද්ධ මුදල් ප්‍රවාහය	**305,863,927**	**-7,653,038**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබුණු මුදල් ප්‍රවාහය		
පොලී ආදායම	1,956,880	46,168,030
ස්ථාවර වත්කම් මිලදීගැනීම්	-192,724,849	-100,900,638
ස්ථාවර වත්කම් සඳහා බැහැර කිරීම	10,000	23,268
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	**-190,757,968**	**-54,709,341**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය		
රජයේ ප්‍රතිපාදන (ප්‍රසම්පාදන	8,445,694	11,611,914
වෙනත් ප්‍රතිපාදන	10,512,683	28,746,841
මුදල් යෙදවීමේ ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ	**18,958,337**	**40,358,754**
මුදල් සහ සමාන දෑවල ශුද්ධ වෙනස්වීම	134,064,336	-22,003,625
කාල සීමාව ආරම්භයේ මුදල් සහ සමාන දෑ	94,773,584	116,777,209
2021.12.31 දිනට මුදල් සහ සමාන දෑ	**228,837,920**	**94,773,584**
සටහන - මුදල් සහ සමාන දෑ		
බැංකුවේ සහ අත ඉතිරි මුදල්	228,837,920	94,773,584
	228,837,920	**94,773,584**

ගිණුම් සටහන්

1. ගිණුම් සඳහා වූ පදනම

සාමාන්‍ය පිළිගත් ගිණුම් ප්‍රතිපත්ති, මූලික උපකල්පන, රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිති සහ විටින් විට වරලත් ගණකාධිකාරීන්ගේ ආයතය මගින් හඳුන්වාදුන් ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව සහ පහත සඳහන් කරුණු සැලකිල්ලටගෙන මූල්‍ය ප්‍රකාශන සකස්කර ඇත.

(අ) ලාභ සහිතව පවත්වාගෙනයන ආයතන.

(ආ) ගිණුම් ප්‍රතිපත්ති අඛණ්ඩව භාවිත කිරීම.

(ඇ) උපචිත පදනමින් ආදායම සහ වියදම් හඳුනාගැනීම.

(ඈ) ප්‍රමිතිවලින් බැහැරවීම හෙළි කිරීම

2. සාමාන්‍ය ගිණුම් ප්‍රතිපත්ති

2.1 ක්ෂය කිරීමේ ප්‍රතිපත්ති

(ආ) පහත සඳහන් ප්‍රතිශතයන් අනුගමනය කරමින් සරල මාර්ග පදනම් කරගෙන ස්ථාවර වත්කම් ක්ෂය කරනු ලැබේ.

ස්ථාවර වත්කම් වර්ගය	%
ගොඩනැගිලි	2.5
යන්ත්‍රසූත්‍ර සහ විද්‍යුගාර උපකරණ	20
ලී බඩු සහ සවිකිරීම්	10
වාහන	20
සාමාන්‍ය කාර්යාලයීය උපකරණ	20
ඇඳිම සඳහා භාවිත කරන කාර්යාලයීය උපකරණ	20
මෙවලම්	20
පුස්තකාල පොත්	10
ගිනි නිවීමේ උපකරණ	50
ස්ථාවර වත්කම් වර්ගය	5
ගොඩනැගිලි	10

2.2 අවසාන තොග ගණනයකිරීම

භාවිත නොකරන ලද භාණ්ඩ තොග පිරිවැය මත ගණනයකර ඇත.

2.3 පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

පාරිතෝෂික පනත අනුව පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන ගණනය කරන ලදී.

2.4 අවිනිශ්චිත ණයකරුවන් සඳහා ප්‍රතිපාදන

පහත සඳහන් කරුණු පදනම් කොට අවිනිශ්චිත ණයකරුවන් සඳහා ප්‍රතිපාදන සපයා ඇත:

(අ) අවු. 2-10 පුරා හිඟ ණය සඳහා 1 % ප්‍රතිපාදන සපයනු ලැබේ.

(ආ) අවු. 10 ක් පුරා හිඟ ණය සඳහා 25 % ප්‍රතිපාදන සපයනු ලැබේ.

මානව සම්පත් කළමනාකරණය/ධාරිතා සංවර්ධනය

ආපදා කළමනාකරණ අංශයේ ආපදා අවදානම අවමකිරීමේ අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා ජා. ගො. ප. සංවිධානයේ ධාරිතා සංවර්ධනය කිරීම සඳහා එහි දැක්ම සහ මෙහෙවර සකස්කර ඇත. ඒ අනුව ජා. ගො. ප. සංවිධානය ඉහල ප්‍රමිතියෙන් යුතු සේවයක් සැලසීමට ආයතනික මෙහෙවර පාර්ලිමේන්තු පනතත් මඟින් නීතිගත කිරීමේ ක්‍රියාවලිය සහ කාර්යමණ්ඩ ධාරිතාවය ඉහල නැංවීම සම්බන්ධයෙන් පියවර ගනිමින් සිටී. 2021 වසරතුල අත්‍යවශ්‍ය පුරප්පාඩුවී ඇති තනතුරු සඳහා නව සේවකයින් බඳවාගැනීම සිදුකර නොමැති අතර සේවකයින් 18 දෙනෙකු ඉල්ලා අස්වීම හා දෙදෙනෙකු විශ්‍රාමයෑම සිදුවී ඇත.

අංකය	වැටුප් කේතය	කාර්යමණ්ඩල ගණය	තනතුරු සංඛ්‍යාව	දැනට සිටින කාර්යමණ්ඩලය (ස්ථිර)	පුරප්පාඩු ගණන (ස්ථිර)	ලබා ගත හැකි අතිරේක කාර්ය මණ්ඩලය (වෙනත් පදනම්)
1	HM 2- 3	ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ප්‍රධාන විධායක නිලධාරී) (CEO)	01	01	0	-
2	HM 1-3	ජ්‍යෙෂ්ඨ කළමනාකරු	08	07	01	-
3	AR2	ජ්‍යෙෂ්ඨ අධ්‍යයන/විද්‍යඥ	25	17	08	-
4	MM 1-1	මධ්‍ය කළමනාකරු	12	10	02	-
5	AR 1	අධ්‍යයන/විද්‍යඥ	124	101	23	51
6	JM 1-1	කණිෂ්ඨ කළමනාකරු	25	19	06	08
7	MA 2-2	කළමනාකරණ සහකාර (තාක්ෂණ)	36	28	08	09
8	MA 1-2	කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)	53	39	14	25
9	PL 1,2&3	ප්‍රාථමික ශ්‍රේණි	102	79	23	44
	එකතුව		**386**	**301**	**85**	**137**

2021 වසරේ ස්ථිර කාර්යමණ්ඩලය බඳවාගැනීම්, විශ්‍රාම ගැනීම් සහ ඉල්ලා අස්වීම්

අංකය	වැටුප් කේතය	කාර්යමණ්ඩල ගණය	බඳවාගැනීම් සංඛ්‍යාව	ඉල්ලාඅස්වූ සංඛ්‍යාව	විශ්‍රාමලත් සංඛ්‍යාව
1	HM 1- 3	ජ්‍යෙෂ්ඨ කළමනාකරු (CEO)	-	-	-
2	HM 1-1	ජ්‍යෙෂ්ඨ කළමනාකරු	-	-	-
3	MM 1-1/JM 1-1	මධ්‍ය/ කණිෂ්ඨ කළමනාකරු	-	03	02
4	AR2	ජ්‍යෙෂ්ඨ අධ්‍යයන/ විද්‍යඥ	-		-
5	AR 1	අධ්‍යයන/ විද්‍යඥ	-	09	-
6	MA 2-2	කළමනාකරණ සහකාර (තාක්ෂණික)	-	04	-
7	MA 1-2	කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	-	2	-
8	PL 1,2&3	ප්‍රාථමික ශ්‍රේණි	-		-
	එකතුව		-	**18**	**02**

කොවිඩ් 19 වසංගතය පිළිබඳ අවදානම් පාලන කමිටුව

කොවිඩ් 19 ව්‍යාප්තිය ජා. ගො. ප. සංවිධානයේ කටයුතුවල සුමට ක්‍රියාකාරීත්වය සඳහා ද බලපෑම් ඇතිකල අතර ඊට අමතර ව සංවිධානයෙහි කාර්යමණ්ඩලය වෙත සෞඛ්‍යය ම ය බලපෑම් ඇතිවිය. ජාතික සෞඛ්‍යය බලධාරීන් විසින් ලබා දී ඇති උපදෙස් පරිදි ජා. ගො. ප. සංවිධානය තුල ආරක්ෂණ මට්ටමක් ක්‍රියාත්මක වේ. ජා. ගො. ප. සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තත්ත්වය කළමනාකරණය කිරීම සහ සිදුවිය හැකි බලපෑම් අවමකිරීම සඳහා කාර්යමණ්ඩල කාණ්ඩවල සාමාජිකයින් 10 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත්කරන ලදී.

කාර්යමණ්ඩල පුහුණුව/වැඩමුළු සඳහා සහභාගීවීම් සහ සම්මන්ත්‍රණ

කොවිඩ් 19 වසංගතය හමුවේ පනවා ඇති සීමාවන් හේතුවෙන් ජා. ගො. ප. සංවිධානය විසින් එහි කාර්යමණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් කිහිපයක් පමණක් සිදුකරන ලදී. විදේශයන් හි ශාස්ත්‍රපති/ආචාර්ය උපාධි පාඨමාලා සඳහා පහත සඳහන් පරිදි විද්‍යාඥයන් දෙදෙනෙකු තෝරාගන්නා ලදී.

2021 වර්ෂයේ විදේශ පුහුණු වැඩසටහන්

අනු අංකය	නම	තනතුර/අංශය	පුහුණු වැඩසහන	කාලය	රට
1	කේ. ඒ. ඩී. එස්. බී. ජයතිලක මයා	විද්‍යාඥ, මානව ජනාවාස සැලසුම් හා පුහුණු අංශය	JICA Long Term Training (PhD) under SATREPS	2021 අප්‍රේල් 01 සිට 2024 මාර්තු 31 දක්වා	ජපානය
2	ඊ. ඒ. එස්. එන්. විමලවර්ධන මයා	විද්‍යාඥ/භූවිද්‍යාඥ	Master Program in Environment Science, degree programs in Life and Earth Sciences under JDS.	2021 සැප්. 30 සිට 2023 සැප්. 30 දක්වා	ජපානය

උපකරණ ප්‍රසම්පාදනය

මහා භාණ්ඩාගාරය වෙතින් 2021 වසර සඳහා ලබාදුන් ප්‍රදානයන් ජා. ගො. ප. සංවිධානයෙහි ධාරිතා ගොඩනැගීම උදෙසා පර්යේෂණ සඳහා රසායනාගාර සහ ක්ෂේත්‍ර උපකරණ ප්‍රසම්පාදනය සඳහා ඵලදායී අයුරින් භාවිතා කරන ලදී. මෙම ප්‍රදානය යටතේ මිලදී ගැනීම සිදුකල ක්ෂේත්‍ර උපකරණ ඇතුලු ප්‍රධාන උපකරණ පිළිබඳ ව පහත වගුවේ දැක්වේ.

අංශය	අයිතමය	දල වටිනාකම (රු. මි.)
පාරිසරික අධ්‍යයන හා සේව අංශය	ආලෝක තීව්‍රතා මාපක	0.50
ගොඩනැගිලි ද්‍රව්‍ය අංශය	අතේ ගෙන යාහැකි කොන්ක්‍රීට්හර විදුම් යන්ත්‍ර හා අර්ධ සෛල විභවමාන	4.00
භූ තාක්ෂණ ඉංජිනේරු හා පරීක්ෂණ අංශය	T 200 පරීක්ෂණ පෙරහන් සහ ක්ෂේත්‍ර උපකරණ උපාංග	0.84

SATREPS ව්‍යාපෘතිය යටතේ ලැබුණු උපකරණ

අනු අංකය	උපකරණ/උපාංග නාමය	වටිනාකම (ජපාන යෙන් මි.)
1	කාළගුණ නිරීක්ෂණ පද්ධතිය	3.00
2	නායාඇම් සඳහා නිරීක්ෂණ පද්ධති (අරණායක සහ අත්වැල්තොට නායයෑම්වල ස්ථාපනය සඳහා ස්වයංක්‍රීය ආතතිමාන, ජලමට්ටම් මීටර් සහ විස්තාරක)	5.30
3	ආතතිමාන මිනුම් පද්ධතිය	3.10
4	නායයෑම් නිරීක්ෂණ උපකරණ	3.90
5	වනාන්තර වර්ෂාපතන මිනුම් පද්ධතිය	0.80
6	Ring Shear උපකරණ (නායයෑම් සමාකරණය)	28.60
	එකතුව	44.70

විගණකාධිපති වාර්තාව 2021



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



මගේ අංකය / எனது இல. / My No. } ඒඑමජී/ඒ/එන්බීආර්ඕ/01/21/12 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2022 මැයි 26 දින

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම්

(අ) සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද පිරිවැය රු. මිලියන 68.3ක් වූ මෝටර් වාහන 09ක්, පිරිවැය රු. මිලියන 248.1ක විද්‍යාගාර උපකරණ සහ රු. මිලියන 43.6ක් වූ කාර්යාල උපකරණ භාවිතා කරමින් පැවතියද රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව එම වත්කම්වල ඵලදායී ජීවිත කාලය නැවත තක්සේරු කර ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 88 ඡේදයට අනුව අස්පෘශ්‍ය වත්කම් රේඛීය අයිතමයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුහුණතෙහි දැක්විය යුතු වුවත් රු. මිලියන 7.3ක් වටිනා අස්පෘශ්‍ය වත්කම්වල වටිනාකම් දේපළ පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 132 ඡේදයට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතු වුවද, සංවිධානය වෙත ලැබෙන දේශීය සහ විදේශීය ප්‍රදාන ගිණුම්ගත කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. නිශ්චිත ප්‍රතිපත්තියක් නොතිබීම හේතුවෙන් පසුගිය වර්ෂවල සංවිධානය වෙත ලැබී තිබූ රු. මිලියන 365.8ක ප්‍රදාන ජංගම වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම, ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ඒජන්සිය මගින් ලබා දී තිබූ රු. මිලියන 44.9ක් වටිනා භාණ්ඩ ආධාර ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20 හි 96 ඡේදය ප්‍රකාරව වත්කම භාවිතය ආරම්භ කළ දින සිට ක්ෂය ප්‍රතිපාදන සැලසීම් ආරම්භ කළ යුතු වුවත්, රු. මිලියන 5.4 ක් වටිනා පරිසණක මෘදුකාංග සඳහා වන ක්ෂය වියදම් වූ රු. මිලියන 1.08ක් මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු. මිලියන 1.08ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) පර්යේෂණ සංවිධානයේ දිස්ත්‍රික් කාර්යාලවලින් ප්‍රධාන කාර්යාලය වෙත ප්‍රේෂණය කරන ලද රු. මිලියන 4.7ක් නියමිත පරිදි හදුනාගෙන ගිණුම්වල ගැලපීමට කටයුතු නොකර හදුනා නොගත් වත්කම් ලැබීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) භිමිකම් වෙනස්වීම් ප්‍රකාශයේ වත්කම් අත්පත් කරගැනීම් ලෙස පෙර වර්ෂවල සිට ඉදිරියට ගෙනවිත් තිබුණු රු. මිලියන 2.26ක හඳුනා නොගත් ශේෂවලට අදාළ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(උ) ලැබීම් පිළිබඳ නීතීමය බැඳියාවක් නොමැතිව ස්ථායිකරණ ක්‍රමවේදය මඟින් නායයෑම් අවදානම් අවම කිරීමේ ව්‍යාපෘතියෙන් ලැබිය යුතු ලෙස රු. මිලියන 37ක ආදායමක් හඳුනාගෙන තිබුණු අතර එම ලැබිය යුතු මුදල් ණයගැනි ගිණුමකට හර නොකර පදනමකින් තොරව කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. එසේම ඉහත ව්‍යාපෘතියේ අයීක්ෂණ කටයුතු සිදු කිරීම වෙනුවෙන් දරන ලද රු. මිලියන 6.1ක් සංවිධානයේ වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ඌ) 2009 වර්ෂයේ සිට සංවිධානයේ මූල්‍ය ප්‍රකාශනවල නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු ලෙස රු. මිලියන 6ක ශේෂයක් අඛණ්ඩව දක්වා තිබුණද, ඊට අනුරූපිව නාගරික සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ශේෂයක් ලෙස එම වටිනාකම දක්වා නොතිබුණි. එසේවුවත් අදාල වෙනස හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගත්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ ඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය

කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙණු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මෙම වාර්ථාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංවිධානය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංවිධානයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ (ඊ) ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණ හැර, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංවිධානයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංවිධානයට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සංවිධානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ)	ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
	(i) මුදල් රෙගුලාසි104 (1)(අ),104 (3) සහ 104 (4)	2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වාහන අනතුරු 23 කට අදාලව රු. මිලියන 3ක් වූ වාහන අලාභ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
	(ii) මුදල් රෙගුලාසි 110	හානි පිළිබඳ විස්තර සටහන් පවත්වාගෙන යෑමට ලේඛනයක් පවත්වාගත යුතු වුවද, සංවිධානය විසින් 2019 වර්ෂයේ සිට එම ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.
	(iii) මුදල් රෙගුලාසි 1642	වාහන සම්බන්ධව සියලුම හදිසි අනතුරු ලහම ඇති පොලිසියට වාර්තා කිරීමට වගබලා ගතයුතු අතර අනතුරු සිදුවී තිබුණු අවස්ථා 10කදී මෙම රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ආ)	2003 ජූනි 02 දිනැති PED 12 චක්‍රලේඛයේ 9.12 ඡේදය	සුබසාධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේදී මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතු වුවත් සංවිධානය විසින් එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව සේවකයින්ගේ රක්ෂණ ආවරණය කිරීම වෙනුවෙන් 2021 වර්ෂයේදී රු. මිලියන 2.6ක වියදමක් දරා තිබුණි.

(ඇ)	2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය	තත්කාර්ය අතුරු අග්‍රිම ලබා ගන්නා නිලධාරීන් විසින් කාර්ය නිම කළ විගස අත්තිකාරම පියවිය යුතු වුවද අවස්ථා 61 කදී ලබාගෙන තිබුණු රු. මිලියන 1.8ක අත්තිකාරම් පියවීම් සඳහා දින 34 සිට දින 102 ක කාල පරාසයක් ප්‍රමාද වී තිබුණි.
(ඈ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4.1 වගන්තිය	ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික කමිටුව වගකිව යුතු වුවත් රු. මිලියන 23ක් වූ දිස්ත්‍රික් කාර්යාල සඳහා කුලී පදනම මත වාහන ලබාගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව සිදු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංවිධානයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇතිබව.

2.3 වෙනත් කරුණු

(අ) මූලික ආපදා අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සහ නායයෑම් විස්තාපනය හඳුනාගැනීමේ පද්ධති වෙනුවෙන් 2015 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් මගින් ලැබී තිබුණු රු. මිලියන 7.6ක් සහ නාය යෑම් අවදානම් අවම කිරීමේ අංශය වෙත 2015 වර්ෂයේදී මහා භාණ්ඩාගාරයෙන් ආංකික ආකෘති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ලැබී තිබුණු රු. මිලියන 5ක මුදලද 2021 දෙසැම්බර් 31 දින විටත් අදාල කාර්ය වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි.

(ආ) නායයෑම් අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 150ක් ලැබී තිබුණි. සංවිධානය විසින් සමාලෝචිත වර්ෂය තුළ නායයෑම් අවදානම් ව්‍යාපෘති 02ක් ක්‍රියාත්මක කර තිබුණු අතර ඉන් උපයෝජනය කර තිබුණේ රු. මිලියන 48.45ක් බැවින් රු. මිලියන 101.35ක මුදලක් ඌන උපයෝජිතව පැවතුණි.

(ඇ) රත්නපුර සහ කළුතර දිස්ත්‍රික්කවල විද්‍යාගාර පහසුකම් සහිත කාර්යාල ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 60ක මූල්‍ය ප්‍රතිපාදන සංවිධානය වෙත ලැබී තිබුණි. එකී ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 24.63ක් පමණක් වියදම් කර තිබූ අතර රු. මිලියන 35.37ක් උපයෝජනය කිරීමකින් තොරව පැවතුණි.

(ඈ) සංවිධානය සඳහා නීතිමය තත්ත්වය ප්‍රදානය කිරීම වෙනුවෙන් පනතක් පිළියෙල කිරීම සඳහා ඉදිරිපත් කර තිබුණු අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2010 ජූනි 02 දින අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව පිළියෙල කළ පනත් කෙටුම්පත 2012 සැප්තැම්බර් 10 දින නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමුකර තිබුණ ද පනත 2021 දෙසැම්බර් 31 දින වන විටත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ තාක්ෂණික දායකත්වයෙන් අධි අවදානම් කලාපවල ජීවත්වන පුද්ගලයන් සුරක්ෂිත ස්ථානවල පදිංචි කිරීමේ වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 14ක පවුල් 1000 ක් සඳහා නිවාස ඉදිකිරීමට සැලසුම්කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ නිවාස ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. වර්ෂය තුළ රු.මිලියන 9.76ක් මෙම ව්‍යාපෘතිය සඳහා වියදම්කර තිබූ අතර පෙර වර්ෂවල ලද ප්‍රතිපාදන රු.මිලියන 32.85 ක් උපයෝජනයකින් තොරව පැවතුණි.

(ඊ) නායයෑම් පැතිකඩ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය 2016 වර්ෂයේ ආරම්භකර 2021 වර්ෂයෙන් නිම කිරීමට සැළසුම්කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මෙම ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ රු, මිලියන 35 ක මුදලක් මහා භාණ්ඩාගාරයෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ලැබී තිබුණු අතර සමාලෝචිත වර්ෂ තුළ රු. මිලියන 15ක් පමණක් වැය කර තිබුණි. වර්ෂය අවසාන වන විට පෙර වර්ෂයේ ලද ප්‍රතිපාදන වල ඉතිරිවීමද ඇතුළුව රු.මිලියන 34.42 ක් උපයෝජනයකින් තොරව පැවතුණි.

(උ) ණය පදනම මත සේවා සැපයීම සංවිධානයේ ප්‍රතිපත්තිය නොවූවද, ණයට සේවාවන් සැපයීම නිසා සංවිධානයේ රු. මිලියන 38.4ක ණයගැති ශේෂ පැවතුණු අතර එය 2009 සිට 2021 දක්වා කාලයට අදාළ වේ.

(ඌ) 2021 දෙසැම්බර් 31 දිනට නායයෑම් සමීක්ෂණය සඳහා ඉල්ලුම්පත් 11,972ක් ලැබී තිබූ අතර ඉන් 7,202 ක් සඳහා අවදානම් තක්සේරු වාර්තා ලබාදී තිබුණ අතර නිර්දේශ ලබාදිය යුතු ඉල්ලුම්පත් ගණන 4,770 ක් විය. වර්ෂය තුළ නිර්දේශ ලබා දීම සඳහා ලද ඉල්ලුම්පත් ප්‍රමාණයෙන් සියයට 39.84 ක ප්‍රතිශතයක් සඳහා අදාළ සමීක්ෂණ සිදු කර නිර්දේශ ලබා දී නොතිබුණි.

(එ) මහනුවර දිස්ත්‍රික් කාර්යාලයක් පවත්වාගෙන යාමට අවශ්‍ය ගොඩනැගිල්ල කාමර 04 ක්-05 ක් පමණ විය යුතු බවත්, වර්ග අඩි 1500-2000ත් අතර විය යුතු බවත් ලංසු පිරිවිතරවල දක්වා තිබුණි.නමුත් මාසිකව රු.125,000ක් කුලිය ගෙවා වසර 06ක්

තිස්සේ වර්ග අඩි 6,017ක ගොඩනැගිල්ලක් ලබා ගෙන තිබූ අතර එහි කාමර 13ක්ද විය. මේ අනුව අවශ්‍යතාවය මෙන් තුන් ගුණයක ඉඩකඩක් ඇති ගොඩනැගිල්ලක් කුලියට ගෙන තිබුණි.

(ඒ) සංවිධානයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 21ක පුරප්පාඩු පැවතුණි. මේ අතර අධ්‍යක්ෂ (පාලන) තනතුර 2016 වර්ෂයේ සිටද, අධ්‍යක්ෂ (නායයෑම් පර්යේෂණ හා අවධානම් කළමනාකරණ) තනතුර 2018 වර්ෂයේ සිටද පුරප්පාඩුව පැවතුණි. තවද, ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 03ක් වන ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ, විද්‍යාඥ, කළමනාකරු (තාක්ෂණික / රසායනාගාර) යන තනතුරුවලද පුරප්පාඩු සංඛ්‍යාව 19ක් වූ අතර එය වසර 03ක කාලයක සිට පැවතුණි. ජ්‍යෙෂ්ඨ මට්ටමේ ඉහත තනතුරුවල කාර්යයන් සංවිධානයේ අරමුණු ඉටුකර ගැනීමට ඉමහත් දායකත්වයක් සපයන බැවින් එකී තනතුරු සඳහා බඳවාගැනීමට ක්‍රියා නොකිරීමෙන් සංවිධානයේ කටයුතු සඳහා බලපා තිබුණි.

(ඔ) 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කොන්ත්‍රාත්කරුවන් වෙත අත්තිකාරම් ලෙස ගෙවා තිබූ රු. මිලියන 10ක මුදල ප්‍රවර්තන වර්ෂය අවසාන වන විටත් පියවා ගෙන නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

NATIONAL BUILDING RESEARCH ORGANISATION

99/1, Jawatte Road, Colombo 5.

Tele: 011-2588946, Fax: 011-2502611

e-mail : info@nbro.gov.lk, web : www.nbro.gov.lk